# THE WHITE HACKLE

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව இலங்கை காலாட் படை சஞ்சிகை

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

www.lightinfantry.lk



## අටවන කණ්ඩුලගේ සම්ප්‍රාප්තිය



79

JANUARY - MARCH

2014



රෙම ශ්‍රීලපාහ මානි I (පාලන) නි/61568
ලුතිතන් කර්නල් ඒඑම්සීපී විජේරත්න
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ මානි I ( සම්බන්ධීකරණ ස්වෙච්ඡා)
නි/2942 ලුතිතන් කර්නල්
ඩබ්ලිව්පීපී සිසිර කුමාර ආර්එස්පී ශ්‍රීලපාහ



5(සෙව්) ශ්‍රීලපාහ අණදෙන නිලධාරි
නි/4787 මේජර්
ටීඑම්ර්ආර්කේ තෙන්නකෝන් ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ විධායක අධිකාරි
නි/63985 මේජර්
ටිඩබ්ලිව්පීඩීඑම් අමරසිංහ පීඑස්සී ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ ක්‍රීඩාභාර නිලධාරි
නි/64001 මේජර්
එච්එච්එස්පීඑස් ද සිල්වා ආර්එස්පී ශ්‍රීලපාහ



2 (සෙව්) ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/5035 මේජර්
කේකේඅයිඑ් කුමාර ශ්‍රීලපාහ



4 ශ්‍රීලපාහ ක්‍රියාන්විත හා පුහුණු භාර නිලධාරි නි/64680 මේජර් ර්ඒඑල්සී ඉදිරිසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ

සුබ මොහොතින්
නව තනතුරට පත් වූ ඔබට
රෙජිමේන්තු අධිපති ඇතුළු
සියලුම නිලයින්ගේ උණුසුම්
සුබ පැතුම්...!



6 ශ්‍රීලපාහ විධායක අධිකාරි
නි/67930 ලුතිතන්
කේව්එස්කේ විතානගේ ශ්‍රීලපාහ



6 ශ්‍රීලපාහ බුද්ධි නිලධාරි
නි/69099 ලුතිතන්
එච් රත්නායක ශ්‍රීලපාහ



17 (සෙව්) ශ්‍රීලපාහ බුද්ධි නිලධාරි නි/9877
2/ලුතිතන් එස්එස්එම්එම් හේරත් ශ්‍රීලපාහ

# THE WHITE HACKLE

**79th Issue January - March 2014** www.lightinfantry.lk

Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry


# CONTENTS


| | PAGE |
|---|---|
| අදහස් උදහස් හා විවේචන | 02 |
| සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරවය දැක්වීම සඳහාය | 03 |
| රෙජිමේන්තු අධිපතිගේ නව වසරේ පණිවුඩය | 04 |
| සාමසාධක රාජකාරි නිමාවෙන් පසු මව්බිමට | 05 |
| ශ්‍රී ලංකා පාබල හමුදා සංගමයේ 63 වන සංවත්සරය | 06 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 07 |
| ජාතික කොඩිය භාවිතය රීති සංග්‍රහය | 08 ~ 09 |
| සේවාවනිතා විත්ති | 10 ~ 11 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 12 – 18 |
| රෙජිමේන්තු අධිපති ගේ ශ්‍රීලපාහ ඒකක සංචාරය | 19 ~ 21 |
| ලෙබනන් රාජ්‍යයේ සංචාරය සිදු කළ ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරී | 22 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 23 |
| How to be a Leader wiht an Extreordiiry Life | 24 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 25 ~ 27 |
| අටවන කණ්ඩුලගේ සම්ප්‍රාප්තිය | 28 |
| ශ්‍රීලපාහ රණවිරු සංසදය | 29 |
| සුබ උපන් දිනක් .. | 30 |
| නව පත්වීම් | 31 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 32– 33 |
| ක්‍රීඩා පුවත් | 35– 36 |
| තල් අරඹේ සිට | 37– 38 |
| දසුනේ හසුන | 39 |
| ප්‍රහේලිකා අංක 58 | 39 ~ 40 |





12 නැත ඔබ තනි කළේ අප



17 ජීවිතයක් ජීවත් කරනට



25 ජාති බේද කිසිත් නෑ අපේ




## කවරයේ කථාව

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ අටවන කණ්ඩුල ලෙසින් අභිෂේක ලද කුඩා ඇත් පැටවා 2014 ජනවාරි මස 29 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ උතුමානන්ගේ සුරතින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිතුමන් වෙත ලබාදුන් මොහොත හා ඉන් පසු අතිගරු ජනාධිපති උතුමානන් විසින් පළතුරු සංග්‍රහයක් කණ්ඩුල වෙත ලබාදෙන සේයා රූ මෙවර කවරයේ කතාවෙන් විදහා දක්වේ.


Printed by

වයිට් හැකල් මුද්‍රණාලය

Sri Lanka Light Infantry
Army Cantonment
Panagoda, Homagama.

# THE WHITE HACKLE

SRI LANKA
LIGHT INFANTRY QUARTERLY

Colonel of The Regiment
Maj Gen KADA Karunasekara RSP USP ndu psc

Centre Commandant
Col CD Weerasuriya RSP

Chief of Staff RHQ SLLI
Col AS Wickramasena RWP RSP psc

Adjutant RHQ SLLI
Maj TWGDM Amarasinha psc SLLI

## The White Hackle Editors

Chief Consultant
Maj Gen KADA Karunasekara RSP USP ndu psc

Editor in Chief
Col CD Weerasuriya RSP

Assistant Editors
Maj TWGDM Amarasinha psc SLLI
Maj AS Kumara SLLI
(Officer In Charge )

Honourary Consultants
Lt Gen RMD Rathnayake WWV RWP RSP USP ndu psc
(Commander of the Army)
Maj Gen HV Athukorale VSV psc FBIM
(Retd – Reg Force)
Brig AER Abeyesinghe KSV
(Retd – Vol Force)

Computer Type setting & Designed
C/SGT Gunasiri SHIUK

Publisher - Regimental Centre
Sri Lanka Light Infantry

Telephone- 0112855204
0112855356 - 60
Ext - 57656
Fax - 0112855204
E-mail - editor.whitehackle@gmail.com
editor.whitehackle@yahoo.com
Website - www.lightinfantry.lk


## Feedback

### අදහස්, උදහස් හා විවේචන
### Readers Please Write in

The **WHITE HACKLE** the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 79th issue. This quarterly is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of **WHITE HACKLE** depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through **" THE WHITE HACKLE "**, the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to **" THE WHITE HACKLE "** We are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is **" Ich Dien", " I Serve"**. Let **'White Hackle'** be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

-Editor-

මහ බ්‍රිතාන්‍යයෙන් නිදහස් නිවහල් බාවය ලැබූ ශ්‍රී ලංකාව 1972 මැයි මස 22 වන දින පූර්ණ නිදහස ලැබීන. එතැන් පටන් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ලෙසින් අභිමානවත් හා ප්‍රෞඪත්වයෙන් බැබලනු ශ්‍රී ලංකාව 1983 ජූලි මස 23 වන දින ශ්‍රී ලංකා පාබල හමුදාවේ ලුතිතන් වාස් ගුණවර්ධන ඇතුලු සාමාජිකයින් 13 දෙනෙකු ගේ ජීවිත අහිමි කරමින් කුරිරු ත්‍රස්තවාදීන්ගේ බෙදුම්වාදී අරගලය ආරම්භය සනිටුහන් විය. එතැන් පටන් තිස් අවුරුද්දක් පුරාවට පැවතුන ත්‍රස්තවාදය 2009 මැයි මස 19 දින වන විට ශ්‍රී ලංකාවෙන් තුරන් කිරමට හැකි විය. මෙම මානුෂිය මෙහෙයුමේදී ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව හා පොලිසියේ ක්‍රියා දාමය මුලු ලොවටම විශ්මිත ජනක විය. එහි ආඩම්බරය අප සැම නිහතමානිව මුලු ශ්‍රී ලාංකිකයින් සමඟ බෙදා හදා ගන්නා ලදී.

මෙවන් නිදහසක් ලැබූ අප අභිමානවත් ලෙසින් හැටහයවන නිදහස් උළෙල සේනාධිනායක අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ උතුමානන්ගේ ප්‍රධානත්වයෙන් කෑගල්ල පුරවරයේදී සමරන්නට යෙදුනු. මෙම උත්සවය විශේෂත්වයක් ගෙන දුන් කරුණක් වුයේ අතීතයේ විදේශිකයින්ගේ ආක්‍රමණයට යටත් වූ ලාංකික ජනයා වෙනුවෙන් ඉදිරිපත් වූ වීර සිංහලයින් බිහි වූ පුරවරයක මෙන්ම වීර සිංහලයින් ලක්මැණියන්ට අහිමි කරවූ පුරවරයක පැවතීමය.

එවන් වූ වීර චරිත බිහිවූ ලක් මැණියන්ගේ වත්මන් වීරපුතුන් බිහිවූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉපැරණි රෙජිමේන්තුවේ පාබල පුත්තු වගයෙන් අනාගතය වෙනුවෙන් ඇපකැප කිරම් රාශියක් සිදු කිරමට ඇත. එම කාර්යයන් අන් අයට ආදර්ශයක් ලෙසින් ඉටු කිරමට මෙම ලැබූ නව වසරේ අප සැම අධිටන් කර ගනිමු.

The White Hackle is published quarterly under the supervision of the Regimental Centre Commandant to educate the Sri Lanka Light Infantry Officers and men on various topics including news, information on activities, people, policies, operations, technical developments, views, opinions and ideas to satisfy their reading thirst. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn. 57656. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, of PA Army HQ CBO by letter No. A/275/27 of 16 Mar, 94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

## සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ට ගෞරව දැක්වීම සඳහාය

## IN HONOUR OF THOSE SLLI HEROES WHO MADE THE SUPREME SACRIFICE

**1983 වසරේ සිට මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවි පුද කළ ශ්‍රීලපාහ වීරෝදාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් ඔවුන්ගේ නාමලේඛනය 1999 ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පළ කරනු ලැබේ.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3751 | S/308062 | Sgt | Jayasundara WN | 10 SLLI | Ge:Hos: ANP | 01/05/2009 |
| 3752 | S/207805 | L/Cpl | Wijekumara RMA | 10 SLLI | Ge:Hos: ANP | 03/05/2009 |
| 3753 | S/184608 | Cpl | Kurampola KRSC | 12 SLLI | Mullaitivu | 04/05/2009 |
| 3754 | S/310667 | Cpl | Rajapakshe RPP | 11 SLLI | Pudumathalan | 07/05/2009 |
| 3755 | S/317170 | L/Cpl | Sanjeewa KGP | 11 SLLI | Pudumathalan | 08/05/2009 |
| 3756 | S/320020 | L/Cpl | Sunil Kithsiri HM | 6 SLLI | Pudumathalan | 08/05/2009 |
| 3757 | S/320035 | L/Cpl | Dissanayaka DMSK | 6 SLLI | Pudumathalan | 10/05/2009 |
| 3758 | S/318020 | L/Cpl | Rajapakshe RPL | 11 SLLI | Pudumathalan | 10/05/2009 |
| 3759 | S/320595 | Cpl | Kumarasinghe NA | 11 SLLI | Pudumathalan | 10/05/2009 |
| 3760 | S/212622 | L/Cpl | Wikcramarathna RHHB | 11 SLLI | Pudumathalan | 10/05/2009 |
| 3761 | S/212204 | L/Cpl | Kasun Tharanga KS | 11 SLLI | Pudumathalan | 10/05/2009 |
| 3762 | S/187249 | L/Cpl | Anura RA | 11 SLLI | Pudumathalan | 10/05/2009 |
| 3763 | S/16D00242 | Cpl | Jayampathi Bandara AMUG | 11 SLLI | Pudumathalan | 10/05/2009 |
| 3764 | S/202517 | L/Cpl | Jayasuriya HGK | 11 SLLI | Pudumathalan | 10/05/2009 |
| 3765 | S/212243 | L/Cpl | Jayakody HPDN | 11 SLLI | Victory HOS | 10/05/2009 |
| 3766 | S/44087 | L/Cpl | Pushpakumara BGAMS | 11 SLLI | Pudumathalan | 10/05/2009 |
| 3767 | S/47015 | L/Cpl | Dodangoda DD | 11 SLLI | Pudumathalan | 10/05/2009 |
| 3768 | S/319687 | L/Cpl | Suresh Gamage MKGI | 11 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3769 | S/313220 | L/Cpl | Wijesundara BA | 6 SLLI | Victory HOS | 11/05/2009 |
| 3770 | S/321318 | L/Cpl | Kasturiarachchi KASW | 11 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3771 | S/196973 | L/Cpl | Sanjeewa RP | 11 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3772 | S/199201 | L/Cpl | Madusanka KKADN | 11 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3773 | S/319636 | L/Cpl | Saman Kumara RMT | 11 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3774 | S/KSDR0025 | L/Cpl | Nimal HM | 11 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3775 | S/197306 | L/Cpl | Munasinhe RDS | 6 SLLI | Victory HOS | 11/05/2009 |
| 3776 | S/306460 | C/Sgt | Wimalaweera MKS | 6 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3777 | S/320037 | L/Cpl | Wickramasinghe WG | 6 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3778 | S/197405 | L/Cpl | Rathnayaka RMDM | 6 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3779 | S/307020 | Sgt | Thilakarathna PRUG | 6 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3780 | S/305949 | L/Cpl | Sujith RP | 6 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3781 | S/212144 | L/Cpl | Priyasad KKD | 6 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3782 | S/320063 | L/Cpl | Ekanayaka EMMP | 6 SLLI | Pudumathalan | 11/05/2009 |
| 3783 | S/212694 | L/Cpl | Wijesinghe WMSK | 6 SLLI | Victory HOS | 11/05/2009 |
| 3784 | S/320535 | Cpl | Pradeep Kumara KMR | 12 SLLI | Pudumathalan | 12/05/2009 |
| 3785 | S/44147 | L/Cpl | Nawarathna RMSCB | 12 SLLI | Pudumathalan | 12/05/2009 |
| 3786 | S/43621 | L/Cpl | Chandrasekara RSMPK | 6 SLLI | Pudumathalan | 12/05/2009 |
| 3787 | S/197570 | L/Cpl | Nimal PM | 6 SLLI | Pudumathalan | 12/05/2009 |
| 3788 | S/319438 | Cpl | Subasiri JA | 6 SLLI | Pudumathalan | 12/05/2009 |
| 3789 | S/313078 | Cpl | Senanayaka SS | 6 SLLI | Pudumathalan | 12/05/2009 |
| 3790 | S/197203 | L/Cpl | Vidana Arachchi WAP | 6 SLLI | Pudumathalan | 12/05/2009 |
| 3791 | S/302625 | Cpl | Ranjith UG | 6 SLLI | Pudumathalan | 12/05/2009 |
| 3792 | S/305426 | Sgt | Darmasiri HA | 11 SLLI | Pudumathalan | 12/05/2009 |
| 3793 | S/208214 | L/Cpl | Maddumage CV | 11 SLLI | Victory HOS | 13/05/2009 |
| 3794 | S/304293 | C/Sgt | Dissanayaka TRS | 6 SLLI | Mullaitivu | 14/05/2009 |
| 3795 | S/199306 | L/Cpl | Senanayaka HDSS | 12 SLLI | Mullaitivu | 14/05/2009 |
| 3796 | S/199692 | L/Cpl | Nawarathna AHMS | 12 SLLI | Mullaitivu | 15/05/2009 |
| 3797 | S/314068 | L/Cpl | Bandara UGUT | 11 SLLI | Pudumathalan | 17/05/2009 |
| 3798 | S/214151 | L/Cpl | Liyanage SAL | 11 SLLI | Pudumathalan | 17/05/2009 |
| 3799 | S/51552 | L/Cpl | Sunil WG | 19 SLLI | Pudumathalan | 17/05/2009 |
| 3800 | S/314117 | Cpl | Ariyarathna MACK | 19 SLLI | Pudumathalan | 17/05/2009 |

තව කොටසක් ලබන කලාපයේ

# රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඑඩීඑ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් නිකුත් කරන ලද 2014 වර්ෂයේ අලුත් අවුරුදු පණිවුඩය

වර්ෂ 1881 සිට පැවැත්වෙන දනට වසර 133 දක්වා වූ දීර්ඝ සහ ප්‍රෞඪ ඉතිහාසයනට උරුමකම් කියන අප රෙජිමේන්තුව 2014 වසරට පා තබන මේ අවස්ථාවේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මව් ඒකකය ලෙස ගරුත්වයට පාත්‍ර වූ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ අධිපති වශයෙන් ඔබ සැම වෙත සුභාශිංසන පණිවුඩයක් නිකුත් කරනුයේ ඉමහත් සතුටින් හා ආඩම්බරයෙනි.

මේ වන විට අප රෙජිමේන්තුව නිත්‍ය බළඇණි 15කින්ද ස්වේච්ඡා බළඇණි 08කින්ද, රෙජිමූබ ශ්‍රීලපාහ බළඇණියකින් සහ රෙජිමේන්තු පුහුණු පාසලකින් සමන්විතව ඇත. ශ්‍රී ලංකා පාබල හමුදා සාමාජිකයින් වන ඔබ සැම විටම ඔබ වෙත පැවරී ඇති වගකීම් සහ කාර්යභාරයන් මනා ලෙස අවබෝධ කරගෙන එය අප විසින් අපගේ මාතෘභූමියටත්, එහි වෙසෙන ජනතාවන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම ලෙස තම කාර්යභාර්ය නිසි ලෙස ඉටු කර ඇත. පාබල හමුදා සෙබළුන් වන අප අන් අයට ආදර්ශයක් වන පරිදි අප රාජකාරීන් උසස් අන්දමින් ඉටු කිරීමට උදාවන නව වර්ෂයේදී ද අධිෂ්ඨාන කර ගනිමු.

අප රෙජිමේන්තුවේ සියලුම නිලයින්ගේ සුබසාධක කටයුතු සඳහා මේ වන විට අවසන් අධියරේ ඉදි කිරීම් කටයුතු සිදුවෙමින් පවතින රණවිරු ස්මාරකය නිමා කරලීම සඳහා ඇවැසි මුදල් ප්‍රතිපාදන සොයා ගැනීම වෙනුවෙන් 2013.12.19 දින සිට 23 දින දක්වා කාලය තුළ හික්කඩුව මහජන ක්‍රීඩාංගනයේදී පැවැත් වූ පාබල මේලා වෙළඳ ප්‍රදර්ශනය සහ සැනකෙළිය ඉතා සාර්ථක අයුරින් පැවැත් වූ අතර, එහි සංවිධායක කටයුතු සඳහා ඔබ සියලු දෙනා ලබාදුන් සහයෝගය කැපවීම ඉතා අගය කොට සලකමි. මෙය වාර්ෂිකව රෙජිමේන්තුව වෙත මුදල් උපයා ගැනීමේ අවස්ථාවක් ලෙස යොදා ගන්නා අතර, මේ තුළින් අප රෙජිමේන්තුවේ සියලුම නිලයින්ගේ සුබසාධන සහ අනෙකුත් අත්‍යාවශ්‍ය කටයුතු වැඩි දියුණු කරලීමට මම අපේක්ෂා කරමි.

අප රෙජිමේන්තුවේ සෙසුනිලයින්ගේ උසස් කිරීම් ගැටලු නිරාකරණය කර වැඩි පිරිසකට උසස්වීම් ලබාදීමට හැකිවිය. තවද, මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් කාය දානය ලබාදෙමින් තම උපරිම සේවය ලබාදුන් රෙජිමූබ ශ්‍රීලපාහ බළඇණියේ සෙබලුන් විශාල පිරිසකට ඔවුනට හිමිවිය යුතු උසස්වීම් ලබාදීමට හැකිවූ බැව් විශේෂයෙන් මේ අවස්ථාවේ මා සිහිපත් කරමි.

එමෙන්ම මේ වන විට ලෙබනන් රාජ්‍යයේ සාමසාධක රාජකාරී සඳහා විදේශගත ශ්‍රී ලංකා පාබල හමුදා සියලුම නිධාරි/සෙසුනිලයින් සිහිපත් කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නා බවත්, ඔවුන් හට පැවැරෙන රාජකාරී නිසි ලෙස ඉටුකර නැවත මව්බිමට පැමිණීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

තවද, පසුගිය වසරේ පැවති අන්තර් රෙජිමේන්තු මලල ක්‍රීඩා තරඟාවලියේදී අප රෙජිමේන්තුව තුන්වන ස්ථාන හා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරඟාවලියේදී අනුශූරතාවය හිමිකර ගැනීමට හැකි වූ අතර, මලල ක්‍රීඩා තරඟාවලියේ උසස් දක්ෂතා දක් වූ ක්‍රීඩකයින් වැඩි පිරිසක් අප රෙජිමේන්තුව නියෝජනය කළ බැව් මේ අවස්ථාවේදී හදපිරි සතුටින් සිහිපත් කරමි.

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත අඩුවක්ව පැවති නවීන උපකරණයන්ගෙන් යුතු අංග සම්පූර්ණ මුලුතැන් ගෙයක්, කොනොනි සමාජ ශාලාවක් සහ සෙසුනිල භෝජනාගාරයක් ඉදිකෙරෙමින් පවතින අතර, එහි වැඩ කටයුතු මෙම වසර තුළදී නිම කිරීමට බලාපොරොත්තු වෙමි.තවද රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත නවතමයෙන් ඉදි කරනු ලැබූ වයිට් හැකල් මුද්‍රණාලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිතුමාගේ සුරතින් පසුගිය වසර අවසාන කාලයේදී විවෘත කරන ලදී.

ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා ඒකීයභාවයත් සුරකීම උදෙසා නොබියව තම ජීවිතය පරදුවට තබා සටන් කළ සියලුම නිලධාරීන් සෙසුනිලයින් හට මේ මොහොතේදී මාගේ කෘතඥතාවය පුද කරමි. යුදමය වතාවරණයන් තුළදී ත්‍රස්තවාදී ප්‍රහාරයන් හේතුවෙන් අප අතරින් වියෝ වූ සියලුම රණවිරුවන් හට ඉක්මන් සුවය ලැබේවායි මා නිරතුරුවම ප්‍රාර්ථනා කරමි. රටදය වෙනුවෙන් මෙවැනි උදාරතර මෙහෙයක් ඉටුකිරීම උදෙසා ඔවුන් බිහිකළ දෙමාපියන්ටත්, ඔවුන්ගේ අඹුදරුවන් සහ සියලුම ඥාතිමිත්‍රාදීන්ටත් කෘතඥතාවය පුද කිරීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ සියලුම නිලධාරීන් සෙසුනිලයින් ඇතුලු පවුල්වල සියලු සාමාජිකයින්ටත්, සිවිල් සේවක මහතුන් ඇතුලුව එම පවුල්වල සියලුම සාමාජිකයින්ටත් ලැබුවාවූ මෙම නව වසර යස ඉසුරින් සපිරි සෞභාග්‍යමත් නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන අතර, සැම භාරදූර කාර්යයක්ම ඉටු කිරීමට ඔබ සැමට තෙරුවන් සරණ හා සියලුම දෙවියන්ගේ ආරක්ෂාව ලැබේවාවි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

**කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී**
**මේජර් ජෙනරාල්**
**රෙජිමේන්තු අධිපති - ශ්‍රී ලංකා පාබල හමුදාව.**

**2014 ජනවාරි මස 01 දින**

# ලෙබනන් රාජ්‍යයේ සාමසාධක රාජකාරි නිමාවෙන් පසු ශ්‍රීලපාහ සාමාජිකයින් මව්බිමට

ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ ප්‍රධානත්වයෙන් එක්සත් ජාතීන්ගේ සාමාසාධක රාජකාරි සඳහා 2013.07.12 වන දින සහ 2013.07.31 වන දින ලුතිතන් කර්නල් ඩබ්ලිව්එස්කේ ලියනවඩුගේ ආර්එස්පී ශ්‍රීලපාහ අණදෙන නිලධාරි වශයෙන් බණ්ඩ දෙකක් ලෙබනන් රාජ්‍යයේ රාජකාරි සඳහා පිටත්ව යන ලදී. මෙම බණ්ඩ සඳහා මූලික රෙජිමේන්තු 13 ක නිලධාරින් 10ක් සහ සෙසුනිලයින් 140ක හටපිරිස් ප්‍රමාණයක් ඇතුළත් වූහ. එවකට ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති හා යුද හමුදා ප්‍රධාන මාණ්ඩලික නිලධාරි වශයෙන් රාජකාරි කළ වත්මන් යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති විසිරයාමේ පෙළපාළියකින් පසු ලෙබනන් රටෙහි රාජකාරි ඉටු කිරීමට විසිර යන ලදී.



ලෙබනන් සාමසාධක රාජකාරි සඳහා විසිර යාමේදී

ලෙබනන් රාජ්‍යයේ මාස හතකට ආසන්න කාලසීමාවක් වෙනත් රටවල් 29ක සාමාජිකයින් සමඟ ඉතා විශිෂ්ට අන්දමින් රාජකාරි සිදු කිරීමේදී අන් රටවල් හී සාමාජිකයින්ගේ ප්‍රසාදයට හා ඇගයීමට ලක් විය. එම රාජකාරින් සාර්ථකව නිම කිරීමෙන් පසු 2014.01.31 සහ 2014.02.12 යන දෙදින තුළ නැවත බණ්ඩ දෙකක් වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණියහ.



ලෙබනන් සාමසාධක කදවුරේ ප්‍රධානිගේ කඳවුරු සංචාරයේදී

ලෙබනන් රාජ්‍යයේ රාජකාරි ඉටු කිරීමේදී කඳවුරු ප්‍රධානි විසින් ශ්‍රී ලංකා හටපිරිස් රැඳී සිටි කඳවුරු පරිශ්‍රය හා සිදු කරන රාජකාරි පිළිබඳවා සොයා බැලීම සඳහා සංචාරයක් සිදු කරන ලදී. එමෙන්ම ශ්‍රී ලංකා යුද හමුදා ක්‍රියාන්විත අධ්‍යක්‍ෂක බ්‍රිගේඩියර් එච්එම්ජේකේ ගුණරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී සාමසාධක රාජකාරි ඉටු කරනු ලබන ශ්‍රී ලංකා කණ්ඩායමේ සුවදුක් විමසා බැලීම සඳහා සංචාරයක් සිදු කරන ලදී.

ලෙබනන් රාජ්‍යයේ සාමසාධක රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සාම සාධක පදක්කමක් හිමි වූ අතර, එම පදක්කම් පෙළපාළියට ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහභාගි විය.



රෙජිමේන්තු අධිපති තුමන් පදක්කම් පැලදීමේ උත්සවයට සහභාගි වෙමින්



බ්‍රිගේඩියර් එච්එම්ජේකේ ගුණරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී සිදු කළ සංචාරයේදී

ලුතිතන් කර්නල් ඩබ්ලිව්එස්කේ ලියනවඩුගේ ආර්එස්පී ශ්‍රීලපාහ

# ශ්‍රී ලංකා පාබල හමුදා සංගමයේ 63 වන මහ සභා රැස්වීම





ශ්‍රී ලංකා පාබල හමුදාවට අනූපමේය සේවයක් ඉටුකර තම තාරුණ්‍යය කැප කරමින් ශ්‍රී ලංකාද්වීපයේ රුදුරු ත්‍රස්තවාදීන් ගෙන් බේරා ගැනීමට කටයුතු කොට අනතුරුව යුද හමුදා සේවයෙන් විශ්‍රාමිකව කාලය ගත කරන පාබල හමුදා රණවිරු විශ්‍රාමිකයින් සෑම වර්ෂයකම මහ සභා රැස්වීමක් හා සුහද හමුවක් පැවැත්වීම සිදු කරනු ලබයි.

2014 වර්ෂයේද මෙම සභා රැස්වීම හා සුහද හමුව පැවැත්වීමට සියලු කටයුතු රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ උපදෙස් මත රෙජිමේන්තු සේනාවිධායක කර්නල් සීඩී වීරසූරිය ආර්එස්පී ගේ අධීක්ෂනය යටතේ 2014 මාර්තු මස 23 වන දින පාබල හමුදා රෙජිමේන්තු මධස්ථානයේදී පවත්වන ලදී.





විශ්‍රාමික සාමාජිකයින් වෙනුවෙන් ඔවුන්ට පැනනැගී ඇති හා ඉදිරියේදී ක්‍රියාත්මක කළ යුතු සුබසාධන කටයුතු පිළිබඳව අදහස් හා යෝජනා සමඟින් පැවැත් වූ මෙම මහ සභා රැස්වීම ඔවුන්ගේ සුබසාධනය වෙනුවෙන් රෙජිමේන්තුවෙන් සිදු කර ඇති මෙහෙය පිළිබඳව ශ්‍රී ලංකා පාබල හමුදා සංගමයේ ගරු සභාපති සහ සියලුම විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරින් ඇතුලු සාමාජිකයින්ගේ ඇගයීමට ලක් වූහ.

මහ සභා රැස්වීම අවසන් වූ පසු පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය දනට ඉදි වෙමින් පවතින රණවිරු ස්මාරකයේ වැඩ කටයුතු හා ගොඩනැගිලි බැලීම හා රෙජිමේන්තු කෞතුකාගාරය නැරඹීමට විශ්‍රාමික පාබල හමුදා සාමාජිකයන් කටයුතු කළහ.

මෙම සුවිශේෂී අවස්ථාවේදී තම පැරණි ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ සාමාජිකයින් හමු වී ඔවුන් සමඟින් මොහොතක් රැඳී සිටිමින් කාලය ගත කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී අමතක කළේ නැත. ඔවුන් සියලුම දෙනා වෙත ගොස් ඔවුන්ගේ දුක සතුට බෙදාහදාගත් අයුරු එම මොහොතේ පැමිණ සිටි සියලු දෙනගේ සිත් සතන් තුළ නිහතමානි ආඩම්බරයක් මෙන්ම සතුටක් ඇති වූහ. පාබල හමුදා විශ්‍රාමික සාමාජිකයින් යුද්ධ හමුදාධිපතිතුමන්හට තිළිණයක් ද ප්‍රදානය කරන ලදී. ශ්‍රීලපාහ අධි රිද්ම කණ්ඩායමේ සත්සර නාදයෙන් වර්ණවත් වූ උත්සවය අවසානයේ විශ්‍රාමික පාබල හමුදා සාමාජිකයන් වෙනුවෙන් විශේෂ දිවා භෝජන සංග්‍රහයක් ද සංවිධානය කර තිබූ අතර, ඉන් අනතුරුව සියලු දෙනා නැවතත් ලබන වසරේදී හමුවීමේ බලාපොරොත්තුවෙන් විසිර ගියහ.





# 10 ශ්‍රීලපාහ පුවත්

# බලඇණි දින සංවත්සරය



ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ දසවන සාමාජිකයා වශයෙන් 1994.01.23 දින යාපනය මාදගල් ප්‍රදේශයේදී ස්ථාපනය කරන ලද 10 බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව දීප්තිමත් බලඇණියක් වශයෙන් දසක දෙකක අභිමානවත් අත්දැකීම් සමුදාය පෙරදැරිකර ගනිමින් වර්ෂ 2014 ජනවාරි මස 23 වන දින තම විසිවැනි උපන් දිනය ඉතා අභිමානවත් අයුරින් සමරන්න ලදී. මෙම ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් කේඩීඑල්සී විජේනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ අණදීම යටතේ මල්ලාවි ප්‍රදේශයේ ස්ථානගතව තම රාජකාරි ඉටු කරනු ලබයි. මෙහිදී ප්‍රදේශයේ ග්‍රාමසේවා වසම් අටක් ආවර්ණය කරමින් නැවත පදංචි කරන ලද ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතය ගොඩ නැගීම වෙනුවෙන් සිවිල් පරිපාලන කටයුතු වලටද මනා දායකත්වයක් ලබාදෙනු ලබයි.

ඒකකය වෙත පැවරී ඇති අධික රාජකාරීන් මධ්‍යයේ වුවද අණදෙන නිලධාරීගේ තිසි මඟපෙන්වීමෙන් ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් විසිවන බලඇණි දිනයට වැඩ සටහන් පෙළගස්වන ලදී. ඒ අනුව බලඇණි දිනට සමගාමීව 2013.12.29 දින ඒකකයේ අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලයින්ගේ සහභාගිත්වයෙන් ඓතිහාසික ශ්‍රී දළදා වහන්සේ වෙනුවෙන් ගිලන්පස පූජාවක් පැවැත් වූහ. මෙම අවස්ථාවේ මාතෘභූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය ආරක්ෂාකර අපගේ මතු පරපුරට නිදහස් නිවහල් දේශයක් උරුමකර දීමේ පරම පවිත්‍ර චේතනාවෙන් කටයුතු කරමින් සිටියදී මියගිය හා අතුරුදහන්වූ වීරෝදාර රණවිරුවන් වෙනුවෙන් පිංපමුණුවා නිවන්සුව ප්‍රාර්ථනා කිරීම හා තුවාල ලබා තව දුරටත් ප්‍රතිකාර ලබමින් සිටින රණවිරුවන්ට නිරෝගී ඉක්මන් සුවයද, සේවයේ යෙදී සිටින අයවළුන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, සිවිල් සේවක මහතුන්ටත් සෙත් ප්‍රාර්ථනා කළහ.

ඒකක හටපිරිස්හි චිත්ත ධෛර්ය හා සුහදත්වය වර්ධනය කර ගැනීමට කණ්ඩායම් අතර, ක්‍රිකට් තරඟ, කඹ ඇදීමේ තරඟ හා ගම හරහා දිවීමේ තරඟයක් සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා පාබල හමුදාවේ දසවන අණදෙන නිලධාරි වෙත බලඇණි දිනදී අභිමානවත් ලෙස කඳවුරු සම්මාන මුරයක් පිරිනමා ගෞරව දක්වීමට බලඇණියේ නිලධාරීන් ඇතුළු සෙසුනිලයින් කටයුතු කළහ. ඉන්පසුව අණදෙන නිලධාරි විසින් බලඇණි දිනය සිහිවීමට මුලස්ථාන භූමියේ අඹ පැලයක් රෝපණය කළේය. ඉන් පසු සියලු දෙනා විසින් යුද්ධයේදී මියගිය සියලුම රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් ආරක්ෂාකර ඔවුනට ගෞරවය දක්වීමෙන් පසු නිලයින් ඇමතීමට අණදෙන නිලධාරි විසින් කටයුතු සිදු කරන ලදී. එහිදී ඒකකය වෙත පැවරී ඇති රාජකාරි ස්වභාවය හා බලඇණිය සමස්ත යුද්ධ හමුදාවේ ගෞරවය හා අභිමානය ආරක්ෂාකර ගනිමින් රාජකාරි ඉටුකළ යුතු ආකාරය පිළිබඳ සියලු දෙනා දැනුවත් කළේය. එදින දිවා භෝජන සංග්‍රහයද සියලුම නිලයින් නියෝජනය වන පරිදි භුක්ති විඳින ලදී.

හටපිරිස්හි ඒකාකාරි රාජකාරි වටපිටාවෙන් මුදවා ඒකක **"වෙන් බියුගල්"** සංගීත කණ්ඩායමේ තත්සරයන්ට හා ගායනයෙන් සංගීත සංදර්ශණයක් හා සුහද සාදයක් පවත්වන ලදී. එමෙන්ම ඒකකය සමඟ රාජකාරි කරනු ලබන සිවිල් සේවක මහතුන්ගේ සේවය ඇගැයීමට අණදෙන නිලධාරි විසින් ඔවුන් හට ත්‍යාග ප්‍රදානයක් සිදු කළහ.

මෙම සුවිශේෂි අවස්ථාවේදී කපිතන් එන්එම්ජීකේසී නෙත්තිකුමාර ශ්‍රීලපාහ විසින් හයිටි රාජ්‍යයේ 16 වන සාම සාධක රාජකාරි සිදු කළ නිලධාරීන් හා සෙසුනිලයින් විසින් රුපියල් ලක්ෂයක පමන වටිනාකමකින් යුත් සංගීත භාණ්ඩයක් (වන්මෑන් ෂෝ කී බෝර්ඩ්) පරිත්‍යාග කරන ලදී.

බලඇණි දිනයට සමගාමීව ඒකක හඨපිරිස්හි සහභාගිත්වයෙන් වව්නිකුලම් ශිවම් කෝවිල සුද්ධ පවිත්‍ර කර බලඇණියට සෙත් පතා දේව පුජාවක් 2014.01.26 දින පවත්වන ලදී. එදිනම ඒකක බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේ සුහද හමුවක් අණදෙන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මෙම අවස්ථාවට ඒකකය සමඟින් රාජකාරි සිදු කළ විශ්‍රාමික බළලත් නිලධාරීන් හා ජ්‍යෙකොනොනින්ද සහභාගි වූය.

ඒකකය සමඟින් රාංකාරි කරමින් සිටියදී දිවිපිදූ රණවිරුවන් හට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් හා තුවාල ලබා ප්‍රතිකාර ලබන රණවිරුවන්ට නිරෝගී ඉක්මන් සුවය ද, දැනට සේවයේ යෙදී සිටින අයවළුන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ටත්, සිවිල් සේවක මහතුන්ටත්, සෙත් ප්‍රාර්ථනා කරමින් 2014.01.28 දින ඒකකයේ අණදෙන නිලධාරි ගේ ප්‍රධානත්වයෙන් මුලස්ථාන කඳවුරේදී මඩුකන්ද විහාරස්ථානාධිපති අති පූජ්‍ය විමලසාර හිමිපාණන් වැඩම කරවා බෝධිපූජා පිංකමක් හා ධර්මානුශාසනාවක් පවත්වා බලඇණි දින වැඩසටහන් මාලාව අවසන් කරන ලදී.


දසවන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව තම විසිවන සංවත්සරය සැමරූ මේ මොහොතේ අතීතයේ සිට විවිධ වූ දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් යුද්ධ හමුදාවේ දිප්තිමත් බලඇණියක් වශයෙන් පෙරට ඒමට හැකිවූයේ ඒකකයට අණදීම සිදු කළ සියලුම අණදෙන නිලධාරීන්ගේ නිවැරදි මඟ පෙන්වීමත්, ඒකකය සමඟින් රාජකාරි ඉටු කළ සියලුම නිලධාරි හා සෙසුනිලයින්ගේ ඉමහත් කැපවීම හා නොපසුබට උත්සාහයත් නිසාවෙන් බැව් මේ සුවිශේෂි අවස්ථාවේ සනිටුහන් කරනුයේ ඉතාමත් ගෞරවයෙනි.





බුද්ධි අංශය 10 ශ්‍රීලපාහ

# ජාතික කොඩිය භාවිතය රීති සංග්‍රහය



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ ජාතික කොඩිය

ජාතික කොඩියට ගරු කරන්න. ඉන් ඔබ ඔද වැඩි යනු ඇත. ජාතික කොඩියෙන් ද්වනිත වන මූලික පණිවුඩයයි මේ. මෙය සෑම ලාංකිකයෙකුම වෙත පත්විය යුතු පණිවිඩයකි. ජාතික කොඩිය අප මව් බිමේ ද අපගේ ස්වාධිනත්වයේ ද අප ජනතාවගේ එක්සත් බවේද සංකේත විම ඊට හේතුවයි. එය ජාතියේ අනාගතය සදහා ඇති අපගේ බලාපොරොත්තුව හා පැතුම පිළිබිඹු කරන සංකේතයකි.


ජාතික කොඩියෙන් ඉන් අදහස් කරන්නේ කුමක්ද යන්නත් පිළිබඳව අප එක් එක්කෙනා වඩාත් ගැඹුරු ලෙස සිතා බැලිය යුතුවේ. එවිට ජාතික කොඩිය දකින සෑම විටම අපද දෙඋර සෘජුව අප හද පුබුදු වි අපගේ සිතුම් පැතුම් මව් බිම දෙස යොමුවිම නිරායාසයෙන්ම සිදුවිය යුතු යි.

ජාතික කොඩියෙන් මෙලෙස ජනිත වන හැගිම් ඇත්තෝ භාග්‍ය සම්පන්න ශ්‍රී ලාංකිකයෝයි. තමන් මේසේ අන්‍යයන්ටද ද ආදර්ශමත් විමෙන් ජාතික කොඩිය පිළිබඳ නිවැරැදි ආකල්පයක් පහල කැර ගැනිමට ඔවුන් යොමු කරවිම මෙවැනි ශ්‍රී ලාංකිකයන්ගේ යුතු කමයි.


මීට කලින් අපගේ ජාතික කොඩිය වූයේ කන්ද උඩරට රාජධානියේ අන්තිම රජුගේ රාජකීය ධජයයි. එහි තද රන් පැහැයෙන් යුත් පසු බිමක දකුණතින් කඩුවක් ගත් සිංහයෙක් කහ පැහැයෙන් නිරූපණය විය. කොඩියේ කොන් සතරේ කහ පැහැයෙන් යුත් කොත් (කේතු) හතරක් ද, කොඩිය වටා දිවෙන කහ පැහැති වාටියක් ද ඇත. අපගේ වර්තමාන ජාතික කොඩිය 1978 සැප්තැම්බර් මස 07 වන දින ප්‍රකාශයට පත්කරන ලද ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසකි. මීට කලින් තද රතු පසු බිමෙහි තිබුණු කහ පැහැති සිංහ රූපය එසේම තබා ඇත. රක්තවර්ණ පසුබිමේ මුළු සතරෙයි කහ පැහැති බෝපත් සතරක් වේ. තැඹිලි සහ කොළ පැහැයෙන් යුක් එකම ප්‍රමාණයේ සිරස් තීරු දෙකකින් සුළු ජන කොටස් නියෝජනය වේ. මෙකී තීරු දෙකේ ප්‍රමාණය කොඩියේ සම්පූර්ණ ප්‍රමාණයට සාපේක්ෂ වශයෙන් බලන විට 1:1:5 යන අනුපාතයන් වේ. කොඩිය වටා කහ පැහැති වාටියක් වැටී ඇත. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇති එස්.එල්.එස්. 693 : 1985 අංක දරණ ශ්‍රී ලංකා ජාතික කොඩිය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතරයෙහි අපගේ වර්තමාන ජාතික කොඩිය පිළිබඳ වූ විස්තරාත්මක පිරිවිතරයන් සදහන් කොට ඇත.

01





02



03

## ජාතික කොඩිය ප්‍රදර්ශනය කළ යුතු අවස්ථා

පහත දැක්වෙන අවස්ථාවන්හි දි ජාතික කොඩිය ප්‍රදර්ශනය කළයුතුය.

❖ ජාතික දිනය හා රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ජාතික වශයෙන් වැදගත් එවැනි වෙනත් දිනයන්හි දි.

❖ සියලුම රාජ්‍ය උත්සවයන්හි දී.

1. එළිමහනේ දී

❖ ජාතික කොඩිය ප්‍රදර්ශනය කරනු ලබන කවර අවස්ථා වුවද එයට ඉහළම ගෞරවනීය ස්ථානය දිය යුතු අතර, එය පැහැදිළිව පෙනෙන ස්ථානයක සවිකර තැබිය යුතුය.

❖ විදේශ රාජ්‍ය නායකයෙකු මෙරට පැමිණි අවස්ථාවක දී ඔවුගේ ජාතික කොඩිය ප්‍රදර්ශනය කරන ලබන විට ශ්‍රී ලංකා ජාතික කොඩිය ද ප්‍රදර්ශනය කළයුතුය.

❖ සෑම අවස්ථාවකදී ම ජාතික කොඩිය එසවීමේ කාර්යය ද එය පහත් කිරීම ද සෙමින් හා ගෞරවාන්විතව කළ යුතුයි. ( අංක 01 චිත්‍රය බලන්න )

❖ ජාතික කොඩිය ඔසවා තැබිය යුත්තේ එහි සිරස් තීරු දෙක කොඩි ගස දෙසින් සිටිනා පරිදිය.( අංක 02 චිත්‍රය බලන්න)


❖ සෑම උත්සවයකදීම ජාතික කොඩියට ප්‍රමුකතම ස්ථානයක් දිය යුතුය. වෙනත් කිසිම කොඩියක් ඊට ඉහළින් ඔසවා නොතැබිය යුතුය. වෙනත් ජාතීන්ට අයත් කොඩි ඔසවා තබන්නේනම් ඒවා ජාතික කොඩි ගසට සමාන උසින් සිටින සේ ඔසවා තැබිය යුතුවාත් හැර එම කොඩි ශ්‍රී ලංකා ජාතික කොඩියට වම් පසින් තැබිය යුතුය. කොඩි සියල්ල ප්‍රමාණයෙන් දළ වශයෙන් සමාන විය යුතු අතර, ජාතික කොඩියට වඩා විශාල නොවිය යුතුය. සාමකාමී සාමයක දී එක් රටක ජාතික කොඩියට වඩා

# ජාතික කොඩිය භාවිතය
## රීති සංග්‍රහය


ඉහළින් ප්‍රදර්ශනය කිරීම ජාත්‍යන්තර ව්‍යවහාරයට අනුව තහනම් වේ.( අංක 03 චිත්‍රය බලන්න)

❖ රාත්‍රි කාලයක දී වුවත් ගොඩනැගිලිවල ජාතික කොඩිය ඔසවා තැබිය හැකිය. එහෙත් එසේ කළ යුත්තේ ඉතා විශේෂ අවස්ථාවකදී පමණය. එබඳු සෑම අවස්ථාවකදීම කොඩිය ඔසවා තබන තාක් කල් එය විදුලි දාරා ආලෝකයෙන් ආලොකමත් කළයුතුය.

❖ ආගමික කොඩි ප්‍රදර්ශනය කළයුත්තේ ජාතික කොඩිය හා සමාන උසට සිටින පරිදිය. (අංක 04 චිත්‍රය බලන්න )



04




05

❖ ප්‍රාදේශික කොඩි හෝ සමිති, පාසල්, සංගම් ආදියෙහි ධජ පතාක ආදිය ද සමඟ සාමූහික වශයෙන් ජාතික කොඩිය ද ඔසවන අවස්ථාවන්හී දි ජාතික තොඩිය සියල්ලට මැදින් එහි ඉහළම ස්ථානයේ ඔසවා තැබිය යුතුය.( අංක 05 චිත්‍රය බලන්න )

❖ පළාත්වල කොඩි, පාසල් ආදියෙහි ධජ පතාක සමඟ ජාතික කොඩිය ද කොඩි ගසක එකම යොතක එල්ලනු ලබන විට ජාතික කොඩිය ඔසවා තැබිය යුත්තේ ඒ සියල්ලටම ඉහළින් සිටින පරිද්දෙනි.

❖ එකිනෙකට යාව පිහිටි කොඩි ගස් කිහිපයක කොඩි එල්ලනු ලබන විට මුලින්ම එසවිය යුත්තේත් අවසානයට පහත් කළ යුත්තේත් ජාතික කොඩියයි.


❖ ගොඩනැගිල්ලක ජනෙල් පඩියකින් හෝ සඳළුතලයකින් හෝ ඉදිරිපසින් පිටතට නෙරා සිටින සේ සවි කළ කොඩි ගසක ජාතික කොඩිය ඔසවතොත් එය අඩකුඹ කළ යුතු අවස්ථාවකදී හැර කොඩිය ඒ කණුවේ මුදුනෙන්ම එල්ලිය යුතුයි. තව ද එම කණුව තිරස් අතට නොව අංශක 45ක කෝණයක් ඇතිවන පරිදි සවි කළයුතු වේ.( අංක 06 චිත්‍රය බලන්න )



06

❖ වීදියක් මැද ජාතික කොඩිය ප්‍රදර්ශනය කරනු ලබන අවස්ථාවන්හී දි සිංහයා නිසි පරිදි ඍජුව සිටින සේ තිරස් අතට කොඩිය දිග පැත්තෙන් එල්විය යුතුය.( අංක 07 චිත්‍රය බලන්න )

07




❖ ජාතික ශෝක දිනයන්හී දි ජාතික කොඩිය අඩකුඹ කිරීමේ දී කළ යුත්තේ මුලින්ම කොඩිය මොහොතකට කොඩි ගසේ ඉහළටම ඔසවා තබා යලි අඩකුඹ කර තැබෙන ස්ථානය දක්වා පහත් කිරීමය. එහෙත් දවස අවසානයේ ජාතික කොඩිය පහත් කිරීමට පෙර එය නැවතත් මුදුනට එසවිය යුතුය. කොඩිය අඩකුඹ කර තැබිය යුතු අවස්ථාවලදී කොඩි ගසේ මුදුනේ සිට මනින විට තුනෙන් එකක (1/3ක) උස ප්‍රමාණයක් එය පහත් කළ යුතුයි. ජාතික කොඩිය අඩකුඹ කළ යුත්තේ කිනම් අවස්ථාවන්හී ද ද යන්න රජය විසින් තීරණය කරනු ලබනු ඇත.(අංක 08 චිත්‍රය බලන්න )

❖ ජාතික කොඩිය ඔසවනු ලබන විට කාලගුණ තත්ත්වය කුමක් වුවද ඉරිදා දින හා නිවාඩු දින ඇතුළුව සෑම දිනකම හිරු උදාවේ සිට හිරු බැසිම දක්වා එය එකම ස්ථානයක ඔසවා තැබිය යුතුය.


❖ ජාතික කොඩිය කථික වේදිකාවක් මත ඔසවා තබනු ලබන අවස්ථාවන්හි දි කථිකයා සභාවට මුහුණ දුන් විට ඔහුගේ දකුණින් තිබෙන පරිදි එය කොඩි ගසක මුදුනේ ඔසවා තැබිය යුතුය. එසේ නැතහොත් කථිකයාට පිටුපසින් වු බිත්තියට හේත්තු වන සේ ඔහුට ඉහළින් ඔසවා තැබිය යුතුය.( අංක 09 චිත්‍රය බලන්න )

ඉහත දක්වා ඇත්තේ එළිමහනේදී ජාතික කොඩිය භාවිතා කරනු ලබන රීති වන අතර, ජාතික කොඩිය පෙරහැරවල, උත්සව අවස්ථාවන් හ එසවීම, වැරදි අයුරින් ප්‍රදර්ශනය කිරීම, අනිසි ලෙස භාවිතා කිරීම, විදේශයන් හී භාවිතා කිරීම් පිළිබඳ රීති ඉදිරි කලාපයන් තුළින් ප්‍රකාශයට පත් වේ.

08



09



(ස්වදේශීය කටයුතු අමාත්‍යංශය මඟින් ප්‍රකාශිත ජාතික කොඩිය භාවිතය රීති සංග්‍රහය නැමති පොතෙන් උපුටා ගැනීමකි.)

වයිට් හැකල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ

# පාබල හමුදා සේවාවනිතා ශාඛාවෙන් යුද හමුදා සේවාවනිතා ශාඛාවට මුදල් පරිත්‍යාගයක්

ශ්‍රී ලංකා යුද හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් සිදු කරනු ලබන රණවිරු සුබසාධක කටයුතු සඳහා ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් රුපියල් මිලියන පහක (5,000,000.00) මුදලක් 2014.01.24 වන දින පරිත්‍යාග කරන ලදී. මෙම විශේෂිත අවස්ථාව ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී සිදු කළ අතර, යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී හා යුද හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනිය වෙත එම මුදල් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී හා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනී ධනංජනී කරුණාසේකර මැතිනිය විසින් පරිත්‍යාග කරන ලදී.









## පාබල හමුදා ආබාධිත රණවිරුවන්ගේ පැනනැගී ඇති ගැටළු විමසමින්

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි ධනංජනී කරුණාසේකර මැතිනිය විසින් මෙම රෙජිමේන්තුවට අයත් රණවිරුවන්ගේ නිවාස හා වෛද්‍යාධාර ආදී පැනනැගී ඇති ගැටළු පිළිබඳව සොයා බලා විසඳුම් ලබාදීමේ සම්මුඛ පරීක්ෂණයක් රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශණ ශාලාවේදී 2014.03.14 වන දින පවත්වන ලදී.



## රණවිරුවන්ගේ දරුවන්ට හා බිරිඳට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට මුදල් ආධාර ලබාදීම

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි ධනංජනී කරුණාසේකර මැතිනිය විසින් 7 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/303060 කෝප්‍රල් මැයිවත්ත පීජීජ්කේ රණවිරුවාගේ අසනීපව සිටින බිරිඳට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට රුපියල් 50,000.00 වෛද්‍යාධාර මුදලක් 2014.03.13 වන දින පරිත්‍යාග කරන ලදී.

එමෙන්ම 2014 මාර්තු මස 14 වන දින නි/62580 කපිතන් ඩීජේඑම්එම් සිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ හා නි/63940 කපිතන් ඒඑම්එල් ජයන්ත ශ්‍රීලපාහ යන නිලධාරීන්ගේ අසනීප දරුවන්ගේ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට රුපියල් 50,000.00 බැගින් වෛද්‍යාධාර මුදල් ලබාදීමද ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනිය විසින් සිදු කළහ.

# ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව පදනමෙන් ආබාධිත රණවිරුවෙකුට හිසට සෙවනක් සදයි

ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව පදනමේ ගරු සභාපතිනිගේ සම්බන්ධිකරණයෙන් හා සෙන්ට්‍රල් ෆිනෑන්ස් (පුද්ගලික) සමාග මේ මූල්‍යමය දායකත්වයෙන් ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ පූර්ණ අධීක්ෂණ මත ශ්‍රී ලංකා පාබල හමුදා මූලස්ථාණ බලඇණියේ ශ්‍රමදායකත්වයෙන් දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ ඉදි කරන ලද නව නිවහන ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව පදනමේ ගරු සභාපතිනි ලලී කොබ්බෑකඩුව මැතිනියගේ සුරතින් විවෘත කර 2014.01.30 වන දින රෙජිමූබ ශ්‍රීලපාභ ඒකකයේ සෙ/321442 කෝප්‍රල් රත්නායක ආර්එම්පීකේ යන ආබාධිත රණවිරුවා හට පරිත්‍යාග කරන ලදී.









# පාබල හමුදා සේවාවනීතාවන්ගෙන් ආබාධිත රණවිරුවෙකුට හිසට සෙවනක් සදයි

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ මූල්‍ය අනුග්‍රහයෙන් හා ශ්‍රී ලංකා පාබල හමුදා මූලස්ථාන බළඇණියේ ශ්‍රම දායකත්වයෙන් අනුරාධපුර නෙළුම්කුලම ප්‍රදේශයේදී නව නිවසක් බඳි කරන ලදී. එම නිවස ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි ධනංජනී කරුණාසේකර මැතිනියගේ ආරාධනයෙන් යුද හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනියගේ සුරතින් විවෘත කර 2014.02.09 වන දින රෙජිමූබ ශ්‍රීලපාභ ඒකකයේ සෙ/325713 ලාකෝ විතානගේ ඩබ්ලිව්එස් යන ආබාධිත රණවිරුවා වෙත පරිත්‍යාග කරන ලදී.





සේවා වනිතා විත්ති





# 17(සෙව්)ශ්‍රීලපාහ පුවත්

# පූජා සත්කාර

පූජනීය ස්ථානයක් ගොඩනැගීම අප මහා ගෞතම බුදුරජානන් වහන්සේට කරන්නා වූ මහැගි පිංකමකි. එවන් වූ පිංකමක් 17(සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ සියලුම අයවලුන්ගේ ශ්‍රම දායකත්වයෙන් හා බණ්ඩාර හා හෙට්ටිආරච්චි යන දානපතියන්ගේ මූල්‍ය දායකත්වයෙන් වැලිකන්ද කන්දකඩුව ප්‍රදේශයේ ගල්කන්ද විහාරස්ථානයට චෛත්‍යයක් ආසේමු (නැ) ආඥාපතිතුමාගේ මගපෙන්වීම හා උපදෙස් මත ඉදිකරන ලදී.

ගල්කන්ද බෞද්ධ බැතිමතුන් හට මෙම විහාරස්ථානයට වන්දනා මාන කිරීම සඳහා ආසේමු (නැ) ආඥාපති තුමාගේ සුරතින් 2013 නොවැම්බර් මස 26 දින විවෘත කරන ලදී.



බුද්ධි අංශය - 17 සෙව්) ශ්‍රීලපාහ











# පූජා සත්කාර

ඒකක අණදෙන නිලධාරි මේජර් ජේඑච්එම්එස්එස් ජයසුන්දර ශ්‍රීලපාහ ගේ උදාරතර සංකල්පයක් මත ඒකකය සමඟ සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ගේ පවුල්වල දූදරුවන් වෙත පාසැල් උපකරණ බෙදාදීමේ උත්සවයක් 2013.12.26 වන දින ඒකක මූලස්ථානයේදී පැවැත්විය. අනතුරුව අණදෙන නිලධාරි ඔවුන්ට පැනනැගී ඇති ප්‍රශ්ණ විමසා පසුව සෝමාවතිය චෛත්‍ය වන්දනාමාන කිරීමට කටයුතු සිදු කරන ලදී.





# 11 ශ්‍රීලපාහ පුවත්



යාපනය අර්ධද්වීපයේ දිළිඳු ජනතාවට හට නිවාස තනා දීමේ වැඩ සටහන යටතේ 11 ශ්‍රීලපාහ විසින් නැවතත් එවැනි උදාර මෙහෙවරක් සිදු කිරීමට මුල පුරන ලදී. ආසේමු (යා) ආඥාපති මේජර් ජෙනරාල් එම් හතුරුසිංහ ආර්එස්පී එන්ඩීසී අයිජී ගේ සංකල්පයක් මත 51 සේනාංකාධිපති හා 513 බළසේනාධිපතිගේ නිරන්තර මග පෙන්වීම මත ඒකක අණදෙන නිලධාරි නි/62188 ලුතිතන් කර්නල් වීඩීඑස් පෙරේරා ශ්‍රීලපාහ ගේ අධීක්ෂණය යටතේ ඒකකයේ සියලුම අයවලුන්ගේ පූර්ණ ශ්‍රම දායකත්වයෙන් ජේ/233 කන්කසන්තුරයි බටහිර ග්‍රමසේවා වසමේ පදිංචි මුනියන්දි ගනේෂන් මහතා හට මනරම් නිවසක් ඉදිකර දෙන ලදී. මෙම නිවස 2014.01.05 වන දින එළඹුන සුබ මොහොතින් ආසේමු (යා) ආඥාපතිගේ සුරතින් එම නිවස අයිතිකරු වෙත භාරදීම සිදු කරන ලදී. යුද හමුදාව වෙතින් මෙවැනි සත් ක්‍රියා නිරන්තරයෙන් සිදු කර යාපනය ප්‍රදේශයේ ජනතාව හට කිසි දා යුද වතාවරනයක් ඇති නොවේවා යැයි එක සිතින් ප්‍රාර්ථනා කරන්නේමු.





## ප්‍රජා සත්කාර



2014.01.10 වන දින යාපනය අර්ධද්වීපයේ චුල්ලිපුරම් හා අරාලි ප්‍රදේශයේදී 11 ශ්‍රීලපාහ ඒකකය විසින් තවත් ප්‍රජා සත්කාර පෙලකට මුල පුරන ලදී. 2014 ජනවාරි මස 10 දින බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්එස්පී ගේ ආරාධනාව මත ප්‍රංශ ජාතිකයන් වන කොලෙට් රේමන්, ජිනෝ ස්ප්‍රිලි, මුරියල් ඩිපැන්ස් යන විදේශ දානපතියන් හා ඉන්ද්‍රානි මෙන්ඩිස් මහත්මිය ඇතුලු චේතනා ඉන් ශ්‍රී ලංකා සංවිධානයේ කාර්ය මණ්ඩලයේ අනුග්‍රහය මත හා අණදෙන නිධාරීගේ පූර්ණ මෙහෙයවීමෙන් චුල්ලිපුරම් පන්තාගම් කටුකුලම් විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන සිසුන් හට පාසල් පොත් හා බෑග් ප්‍රදානය කළහ. එයට සමගාමීව පාසැල් සිසුන්ගේ දෙමාපියන් හට වියලි සලාක මල්ලක් ප්‍රදානය කරන ලදී.

අරාලි ප්‍රදේශයේ කොඩෙයිකාඩු ප්‍රජා ශාලාවේදී දිළිඳු ජනතාව වෙත මෙදිනම උපැස් යුවල් යුවල් 550 ක් බෙදාදීමේ හා නොමිලේ වෛද්‍ය සායනයක් පැවැත්වීමද සිදු කරන ලදී. මෙහිදී වෛද්‍ය කසුන් විතාන, වෛද්‍ය ජයකාන්තන්, වෛද්‍ය කනතිපන් හා වෛද්‍ය නිශාන්ත යන වෛද්‍යවරුන් ගේ දායකත්වය ලබාදීම සිදු වූහ. තවද යාපනය ප්‍රදේශයේ මේවැනි උතුම් ක්‍රියාවක් කිරීමට සහයෝගය ලබාදුන් සියලුම දෙනා වෙත ඒකකයේ අණදෙන නිලධාරි ඇතුලු සියලුම අයවලුන්ගේ ප්‍රණාමය පුද කර සිටින්නෙමු.

11 ශ්‍රීලපාහ - බුද්ධි අංශය



# 5 (සෙව්) ශ්‍රීලපාහ පුවත්
# නව අණදෙන නිලධාරී



ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ පස්වන බළඇණිය ඒකකය ලෙසින් බිහිවූ 5(සෙව්) ශ්‍රීලපාහට මේ වන විට වසර 27ක දීර්ඝ ඉතිහාසයකට උරුම කම් කියනු ලබයි.

මෙම බළඇණිය ස්ථාපිත කිරීමේදී නායකත්වය ලබාදුන් මෙම ඒකකයේ මුදුන් මුල බඳුවූ බ්‍රිගේඩියර් එම්ජේ අල්විස් (විශ්‍රාමික) (එවකට ලුතිතන් කර්නල්) ඇතුලු මෙම බළඇණිය නගා සිටුවීම සඳහා ක්‍රියාකළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ මෙම බළඇණිය වර්තමාන තත්ත්වය කරා රැගෙන ඒමට නායකත්වය ලබාදුන් සියලුම අණදෙන නිලධාරිවරුන් ඔවුන්ගේ දැඩි කැපවීම, අධිෂ්ඨානය තුළින් පාබල රෙජිමේන්තුවේ ඒකක අතර, දීප්තිමත් ඒකකයක් ලෙස කිරුළු පැලැන්දවීමට හැකියාව ලැබී ඇත.



මෙම ඒකකයෙහි හත් වන අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කළ ලුතිතන් කර්නල් ජීඒල් කිත්සිරි ශ්‍රීලපාහ වසර පහකට වැඩි කාලයක් මෙම ඒකකයෙහි රාජකාරී සිදු කර 2014 පෙබරවාරි මස 12 දින අණදෙන නිලධාරී තනතුර මේජර් ටීඑම්ඊආර්කේ තෙන්නකෝන් ශ්‍රීලපාහ වෙත භාරදී මෙම ඒකකයෙන් සමුග ත්තා ලදී. මෙම මොහොත ඒකකයෙහි නිලධාරීන් ඇතුලු සියලුම නිලයින් හට ඉතාමත් හැඟුම්බර මොහොතක් වූහ. එතුමන් විසින් මෙම ඒකකය ක්‍රියාන්විත රාජකාරි නිමාවෙන් පසු නැවත පල්ලේකැලේ පසු මුලස්ථානය ස්ථාපිත කිරීම සඳහා කළ සේවය මෙම මොහොතේදී කෘතවේදීව සිහිපත් කරන්නෙමු.

නව අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් ලබා දී පිළිගැනීම 2014.02.13 දින සිදු කළේය. එදින 1002 පැයට එළඹි සුබ මොහොතින් ආගමික වතාවත් සිදුකොට සම්ප්‍රදානුකූලව පොල්තෙල් පහන දල්වා රාජකාරි භාර ගැනීම සිදු කරන ලදී.





ඉන්පසු ඒකක හටපිරිස් ඇමතූ මුල්ම අවස්ථාවේදී තමන් දෙවන ලුතිතන් වරයෙකු ලෙස මෙම ඒකකයට පැමින මොහොත සහ අණදෙන නිලධාරිවරයෙකු ලෙස ඒකකයේ කටයුතු සිදුකිරීමට පැමින ගමන් මඟ පිළිබඳව දැනුවත් කළ අතර, එමඟින් නායකයෙකු ලෙස තම අරමුණ කරා තම හටපිරිස් ගෙන යායුතු ආකාරය පිළිබඳ දීර්ඝ විස්තරයක් සිදු කරන්නට විය.

නව අණදෙන නිලධාරීගේ වසර 18ක් වූ තම සේවා කාලය තුළ කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වශයෙන් හෙබවිය යුතු තනතුරු හොබවා විවිධ පාඨමාලා හාදාරමින් විශේෂයෙන් විදෙස් පාඨමාලා හදාරා ක්‍රියාන්විත පාලන හා පුහුණු යන සියලුම අංශයන් සම්බන්ධයෙන් මනා දැනුමක් ඇති අත්දැකීම් සම්භාරයකින් සමන්විත නිලධාරියෙකු වේ. එමෙන්ම දැනුම වෘත්තීය නිපුනත්වය තුළින් ඒකකයේ ආරම්භක නිර්මාතෘවරුන්ගේ අභිලාෂයන් ඉටු කරමින් ශ්‍රී ලංකා පාබල හමුදාවේ අභිලාෂයන් මුදුන්පත් කර සමස්ත යුද්ධ හමුදාව තුළ පස්වන ශ්‍රී ලංකා පාබල හමුදාව දීප්තිමත් බළඇණියක් බවට පත් කරනු ඇතැයි යන්න අපගේ අපේක්ෂාවයි. අණදෙන නිලධාරී තනතුර දක්වා එතුමන් පැමිණි ගමන්මග අපහට ලබාගත හැකි උසස් ආදර්ශයකි. එතුමන්ගේ අපේක්ෂාව වනුයේ මෙම බළඇණිය පාබල හමුදා ඒකක අතර පුහුණු, පාලන හා ක්‍රීඩා යන සියලු අංශයයන්ගෙන් කැපී පෙනෙන ඒකකයක් බවට පත් කිරීමය. එම අභිලාෂය මුදුන්පත් කර ගැනීම සඳහා ඒකකයට අයත් සියලු නිලධාරී සෙසුනිලයින් දායකත්වය කැපවීම ලබාදෙනු ලබන අතර, එම පරමාර්ථයන් අරමුණ කරා ගමන් ගැනීමට එතුමන් හට අවැසි ශක්තිය ධෛර්යය ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය දළදා සම්දුන්ගේ රැකවරණය ලැබේවායි අප නිරතුරුවම ප්‍රාර්ථනා කරන්නෙමු.

**ඒඑම්සීඑස්කේ අගලවත්ත ශ්‍රීලපාහ**
**බුද්ධි නිලධාරී - 5(සෙව්) ශ්‍රීලපාහ**



# 19 ශ්‍රීලපාහ පුවත්

## ජ්‍යෂ්ඨ නිලධාරී සංචාරය





ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ නිත්‍ය බළඇණියක් වන 19 ශ්‍රීලපාහ 65 වන සේනාංකයට අනුබද්ධිතව 651 බළසේනා මූලස්ථානය යටතේ මුලංකාවිල් ප්‍රදේශයේ රාජකාරි කරණු ලබයි. 65 වන සේනාංක නව සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩයස් ගේ ප්‍රථම බළඇණි සංචාරය ලෙස 2014 ජනවාරි මස 04 වන දින 19 ශ්‍රීලපාහ ඒකකයේ සංචාරය සිදු කරනු ලැබීය. ඒකකය වෙතින් සේනාංකාධිපති වෙත සම්මාණ මුරයක් හා සම්මාන පෙළපාළියක් ලබාදීමට කටයුතු සිදු කළහ. අනතුරුව ඒකකයේ දෙවන අණදෙන නිලධාරි ප්‍රමුක නිලධාරින් හා ජ්‍යෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරින් විසින් පිළිගනු ලැබීමෙන් පසු ඒකකයේ රාජකාරි පිළිබඳව දෙවන අණදෙන නිලධාරි ගේ දේශනයකින් අවබෝධයක් ලබාදීමද සිදු කරන ලදී. ඒකකයේ සංචාරය සිහිවීම වස් රුක්රෝපණයක් සිදු කිරීමටද නව සේනාංකාධිපති අමතක නොකළේය. ඒකකය වෙතින් තේපැන් සංග්‍රහයක් පිළිගැන්වීමක්ද සිදු කරන ලදී.

**බුද්ධි අංශය 19 ශ්‍රීලපාහ**



# 1 ශ්‍රීලපාහ පුවත්

1950 මැයි 12 වන දින අභිමානයෙන් ආරම්භ කරන ලද පළවන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව පුරා වසර 63 ක් තිස්සේ මව්බිමේ ඒකීයභාවය උදෙසා ''සේවය කරමි'' යන උදාත්ත පාඨය පෙරදැරි කර ගනිමින් මව්බිමට සේවය ලබාදුන් අද්විතීය බළඇණියකි. අප බලඇණියට අයත්ව තිබූ හබරකඩ කුඹුරු යාය තිස්වසරක යුද්ධය නිසාවෙන් පුරන්ව ගොස් තිබූ අතර, 1958 මැයි මාසයෙන් පසුව එම කුඹුරු සිවිල් ජනයා වෙත අදේට දීමෙන් අණතුරුව ඔවුනට කුඹුරු අස්වැද්ද වීමට නොහැකි වීම නිසා නැවත අප ඒකකය වෙත ලබා ගන්නා ලදී. ඉන් පසුව යුද්ධමය වාතවරණය හේතුවෙන් බළඇණිය රටේ විවිධ ප්‍රදේශවල රාජකාරි කිරීමට සිදුවීම හේතුවෙන් එම කුඹුරු පුරන්ව ගොස් තිබූ අතර, යුද්ධය නිමවී සාමය උදාවීමත් සමඟම අප ඒකකය එවකට බළඇණික් වශයෙන් ස්ථාන ගතව තිබූ පනාගොඩ යුද්ධ හමුදා ජනපදය වෙත 2010.07.07 වෙනි දින නැවත පැමිණීමට වාසනාව උදා විය.

ඒකකය පනාගොඩ යුද්ධ හමුදා ජනපදය වෙත පැමිණීමත් සමඟම විවිධ රාජකාරි කටයුතුවල නිරත වෙමින් සිටියදී 2013.10.05 වන දින ඒකකයේ හටපිරිස් යොදවා පුරන්ව තිබූ කුඹුරුයාය අස්වද්දවා 2014.02.22 වන දින එහි අස්වනු ඒකක අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලධාරි මඩුල්ල හා සෙසුනිලයින් විසින් නෙලා අලුත් සහල් ලබා ගන්නා ලදී.

එම අලුත් සහල් වලින් කොටසක් පළමුවෙන්ම රොමියෙල් මාවතේ පිහිටි ශාඛ්‍යාරාම විහාරස්ථානය වෙත පූජාකරන ලදී. 2014.03.05 වන දින කිරි උතුරවා අලුත් සහල් කිරිබතක් පිළියෙළකර රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සහ ඒකකයේ සියලුම නිලධාරි සහ සෙසුනිලයින් වෙත සහ සිවිල් සේවක මහතුන් වෙතද පිළිගන්වූයේ ඉමහත් සතුටිනි.

## තිස්වසරකට පසු කුඹුරු යාය අස්වද්දයි





**බුද්ධි අංශය 1 ශ්‍රීලපාහ**

# 26 ශ්‍රීලපාහ පුවත්

## නව වසරේ උදාව



2013 වර්ෂයට සමුදී 2014 නව වසර උදාවත් සමඟම අණදෙන නිලධාරි කාර්යාලයේදී කිරි උතුරුවා 2014.01.01 දින උදෑසන සංඝයා වහන්සේලා තුන් නමක් වඩම්මවා හීල් දානය පූජා කළහ. එදින ඒකක බුදු මැදුරේ ස්ථාපිත ශ්‍රී මහා බෝධින් වහන්සේගේ ශාඛාව අභියසදී අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජීජ්කේජී ගනේගොඩ ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් හා සියලුම අයවලුන්ගේ සහභාගිත්වයෙන් නව වසරට ආශිර්වාදය කරමින් බෝධිපූජා පිංකමක් පවත්වා පිරිකර පූජා කරන ලදී.

තවද 2014 වසරේ පළමු දින 0900 පැයට බළඇණි මූලස්ථාන කාර්යාලය ඉදිරිපිටදී ඒකක ධජය ඔසවා අනතුරුව යුද්ධ හමුදාධිපති තුමාගේ පණිවුඩය සියලුම අයවලුන්හට ලබාදීමෙන් පසු ඒකක අණදෙන නිලධාරි විසින් හටපිරිස් ඇමතීමද සිදු කලේය. එමෙන්ම ඒකකයේ අභිනවයෙන් ඉදිකර ඇති සතර මහා දේවාලයේ දේව මෙහෙයක් පවත්වා නව වසරට ආශිර්වාදය කලේය. මෙම පුණ්‍ය කර්මයෙන් පසු පැමිණි සිටි සියලුදෙනාගේ සහභාගිත්වයෙන් තේ පැන් සංග්‍රහයක් ද පැවත්වූහ. ලැබූ නව වසර සැමට සුබදායි වසරක් වේවායි ප්‍රාර්ථනය කරන්නෙමු. **බුද්ධි අංශය - 26 ශ්‍රීලපාහ**





## ඔබ

නොසිදෙනා තත් අතර නොවැයෙනා ඔබ
නොපියෙනා නෙත් අතර නොපෙනෙනා දසුන ඔබ
නිශායට එකළු කළ සුපුන් සඳ මඬල ඔබ
ජීවිතේ ගමන් මග හමු වූ මහ බලය ඔබ

විරාගත තිමිර පට මුදාහැර පවන ඔබ
සාදා හදවතේ රැඳී දැහැන් බිඳී ගිය ඔබ
ලොවක් අබිමුවේ පෑ පිළිරූ බිඳි පහර ඔබ
හඹා ආ සුමට ඉම බොරලු ඇතිරුවේ ඔබ

අහඹුවෙන් ළඳක් තම අරුත් බව කලේ ඔබ
සිත නිල් කඳුකරය දවා අලු කලේ ඔබ
නෙතින් පිටු දැකී පහස කරා යොමු කලේ ඔබ
මධු විතට බිඳු හෙලන සිදී එය පැතුම ඔබ

''පොත පත ඇසුරෙන් ''

**සෙ/319651 කෝප්‍රල් ලක්ෂ්මන් කුමාර ඒඑම්**
**ඩී කණ්ඩායම - 26 ශ්‍රීලපාහ**

## ගෙදර බුදුන් අම්මා

රළු වැලි කතරේ
පිනි වැස්ස ඔබ
මහා සැඬ සුළඟේ
ගල් පුවරුවයි ඔබ
මුදු කරුනාවේ
සාගරයයි ඔබ
අඳුරු වලාවේ
රන් එළියයි ඔබ
මගේ ආදර අම්මා. . .

**සාසෙ සදරුවන් එස්පීඑස්**
**ආධාරක කණ්ඩායම 19 ශ්‍රීලපාහ**

## පායන හිරු වැන්නේ

ඔසරිය ඇඳන් ඉනවට නෙරිය තබාගෙන
වරලස ගොතා පිට මැද්දේ හලාගෙන
පොත් ගොන්නක් ඉගටිය මත රුවාගෙන
පාසල වෙත යයි තුරුළිය උදෑසන

ඇය යන මාවතේ වන මල් පිබි දෙන්නේ
වන වදුලේ සියොතුන් ගී හඬ දෙන්නේ
බන්ඩි ගොයම මඳ සුළඟට ලෙළ දෙන්නේ
අපේ ගමට ඇය පායන හිරු වැන්නේ

**සෙ/315294 ලාකෝ සුරංග බංඩාර ඊඑම්**
**ඩී කණ්ඩායම - 26 ශ්‍රීලපාහ**

## විශ්වාසයි

ගොරවන කොට දැනෙන්න ඕනේ
හෙන ගහලා ඉවරයි කියලා
හෙන ගහන කොට දැනගන්නට ඕනේ
ඊළඟට ගොරවනවා කියලා
විශ්වාසය එක පාරක් කඩ කලාම
දැනගන්න ඕනේ
දෙපාරක් විශ්වාස කරන්න බෑ කියලා

**ලාකෝ රත්නායක ඩබ්ලිව්ජ්එම්ජ්පී**
**බී කණ්ඩායම - 19 ශ්‍රීලපාහ**

## හැරගිය ඔබ

මට නොකියා යන වග
දුක කියලා හොදටම
යන්න ගියේ ඇයි දෝ ඔබ
හඬන දෙනුවන් කකියන
රිදුම් දෙයි පපුව මතට
ප්‍රේමයක් යලි නොවිදිනා
හදවතක් ඇත මම ළඟ

**කෝප්‍රල් ප්‍රේමරත්න පීඩබ්ලිව්එල්ඩී**
**26 ශ්‍රීලපාහ - ඩී කණ්ඩායම**

THE WHITE HACKLE
79th ISSUE - January - March 2014

# 12 ශ්‍රීලපාහ පුවත්

## බළඇණි දින සංවත්සරය

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු කඳවුරු පරිශ්‍රය තුළදී 2007 දෙසැම්බර් 03 වන දින නව බළඇණියක් වශයෙන් නි/60908 මේජර් එච්එම්ඩබ්කේ හේරත් ආර්එස්පී ශ්‍රීලපාහගේ නායකත්වය යටතේ ප්‍රතිස්ථාපනය කරන ලද මෙම බළඇණිය සයවන සංවත්සරය සමරනු ලබන්නේ අභිමානයෙනි. මෙම ඒකකය වන්නි මානුෂිය මෙහෙයුමේදී 59 සේනාංකයේ ප්‍රහාරක ඒකකයක් වශයෙන් උදාර මෙහෙවරක් කරමින් රුදුරු ත්‍රස්තවාදය ශ්‍රී ලංකාද්වීපයෙන් මුලිනුපුටා දැමීමට දායක විය. එම කාර්යයේදි නිලධාරීන් හා සෙසුනිලයින් 01 x 54 දෙනෙකු දිවිපුදා තවත් සෙබළුන් පිරිසක් තුවාල ලබා ඇත.

12 ශ්‍රීලපාහ ඒකකය මීට ප්‍රථම සිදු කළ බළඇණි සංවත්සරයන් වලදීද සමාජ සත්කාර මෙන්ම පුණ්‍ය කටයුතු මූලික කර ගනිමින් වැඩසටහන් සිදු කළේය. මෙවරද 12 ශ්‍රීලපාහ සයවන බළඇණි සංවත්සරයට අනුගාමීව 2013.12.01 දින ඒකක අණදෙන නිලධාරි නි/62451 ලුතිතන් කර්නල් ඩීඑස්එස් රදලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ උපදෙස් මත මියගිය රණවිරුවන්ට, අබාධිත විරුවන්ට හා ඒකකයට සෙත් ප්‍රාර්ථනා කිරීමේ පූජාවක් දෙවන අණදෙන නිලධාරි නි/64896 මේජර් ඩබ්ලිව්ඩීආර් වීරපුර ශ්‍රීලපාහගේ හා අනිකුත් අයවලුන්ගේ දායකත්වයෙන් කැළණි රජමහා විහාරයේදී සිදු කළහ.

2013 දෙසැම්බර් මස 03 වන දින බළඇණි දිනය නිමිත්තෙන් අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් පිරිනමා ඉන් පසු සියලු නිලධාරි හා සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් බළඇණි ධජය ඔසවා රෙජිමේන්තු ගීතය ගායනා කරන ලදී. අනතුරුව අණදෙන නිලධාරි විසින් සියලු නිලයින් ඇමතීමට



අමතක නොකළේය. එහිදී අදහස් දක්වමින් මෙම බළඇණිය ඉතා උසස් මට්ටමක පවතින බවත්, එය තවත් ඉදිරියට රැගෙන යාම බළඇණි සාමාජිකයන්ගේ යුතුකමක් බවත්, රෙජිමේන්තුවේ හා සමස්ත යුද හමුදාවේ කීර්ති නාමයට කැළලක් සිදු නොවන අයුරින් රාජකාරි කටයුතු සිදු කිරීමට කටයුතු කිරීමට සැවොම වග බලාගත යුතු බැව් දන්වා සිටින ලදී.

බළඇණි සංවත්සරය නිමිත්තෙන් ලේ දන්දීමේ කඳවුරක් සංවිධානය කර තිබූ අතර, සියලු සෙනින්ගේ උද්‍යෝගිමත් සහභාගිත්වය හා සහයෝගය මෙම දානමය කටයුත්ත සඳහා යොමු වූ බව මතක් කරන්නේ මහත්වූ ආඩම්බරයෙනි. මෙම ලේ දන්දීමේ වැඩ සටහන ඉතා සාර්ථක කරගැනීම සඳහා සේවා වනිතා ශාඛාව වෙතින් කෙටි ආහාර වේල සඳහා ලබාදුන් අනුග්‍රහයද වැඩසටහන සඳහා සහභාගි වූ ජාතික ලේ බැංකුවේ වෛද්‍ය මණ්ඩලය වෙතින් ලැබුණු සහායද ඉතා අගය කොට සලකන්නෙමු.

සියලු වැඩසටහන් අවසානයේ සියලු නිල දිවා භෝජනා



සංග්‍රහයක් ඒකක අණදෙන නිලධාරිගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි. එසේම සයවන බළඇණි දිනයට සමගාමීව සෙබළුන්ගේ ඒකකාරි මානසිකත්වයෙන් මුදවාලීම සඳහා සියලු නිල සහභාගිත්වයෙන් යුතුව සුහද සාදයක් පවත්වන ලද අතර, එය 12 ශ්‍රීලපාහ 'බියුගලර්ස්' සංගීත කණ්ඩායමෙන් සංගීතවත් කළ අතර, දෙවන අණදෙන නිලධාරිගේ අදහසක් මත නර්ථන




කණ්ඩායම් සහ මැජික් ශිල්පීන් යොදා ගනිමින් එය විචිත්‍රවත් කරන ලදී. මේ සඳහා ඒකකයේ සියලු කණ්ඩායම් මගින් විවිධ අවස්ථාවන් වලදී නාට්‍ය සංදර්ශන ඉදිරිපත් කරමින් සියලු සෙබළුන් විනෝදවත් කරන ලදී.

පුරා වසර හයක් තුළ විවිධ වූ රාජකාරි මධ්‍යයේ සාර්ථක ගමනක් පැමිණි අප ඒකකය ඉදිරි ගමනද සාර්ථකත්වයෙන් සාර්ථකත්වයට පත් කිරීමට ඇවැසි ශක්තිය ධෛර්යය අණදෙන නිලධාරි ඇතුළු සියලු නිලයින්ට ලැබේවා ! යැයි එක සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය 12 ශ්‍රීලපාහ**



# 12 ශ්‍රීලපාහ පුවත්

## වාර්ෂික වෙඩි තැබීම්



වේයන්ගොඩ ප්‍රදේශයේ ස්ථාන ගතවී සිටින මෙම බළඇණිය 2013 වර්ෂය සඳහා වූ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සහ වාර්ෂික වෙඩි තැබීම් පරීක්ෂණය ඉතා සාර්ථකව නිමකරන ලදී.

අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ඩීඑස්එස් රදලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ නිවැරදි මග පෙන්වීම හා දිරිගැන්වීම මත බළඇණි වාර්ෂික යෝග්‍යතා පරීක්ෂණය හා වාර්ෂික වෙඩි තැබීම් පරීක්ෂණය සිදු කිරීමට හැකි විය. මේ සඳහා සියලුම නිලධාරී හා සෙසුනිලයන් එක්ව 2013.12.05 වන දින වාර්ෂික වෙඩි තැබීම් අඹේපුස්ස වෙඩි පිටියේදී සිදු කළ අතර, 2014.01.04 වන දින වාර්ෂික ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයද සිදු කරන ලදී. ඒකකයේ සියලුම නිලයින් ඉතා උද්යෝගයෙන් සහ උනන්දුවකින් යුතුව මෙම පුහුණුවීම් සඳහා සහභාගි විය.

## පූජා සත්කාර



වේයන්ගොඩ ප්‍රදේශයේ පිහිටි ශ්‍රී දැඩිමුණ්ඩ දේවාලයේ ප්‍රධාන කපු මහතා විසින් ඒකක දෙවන අණදෙන නිලධාරී ගෙන් කරණු ලැබූ ඉල්ලීමකට අනුව අණදෙන නිලධාරීගේ උපදෙස් මත එම දේවාලයේ කැඩී බිඳී ගිය ස්ථාන පිළිසකර කිරීම සහ ඒ අවට පිරිසිදු කිරීමේ පුණ්‍යකර්මයක් ඒකකයේ සියලු අයවලුන්ගේ දායකත්වයෙන් සිදු කරන ලදී.පිළිසකර කිරීම් නිමාවෙන් පසු ඒකකයේ ඉදිරි වැඩ කටයුතු සාර්ථක ලෙස සිදු කිරීමට දේවස්ථානයේ පූජා උත්සවයක්ද සියලු නිලයින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

**බුද්ධි අංශය 12 ශ්‍රීලපාහ**

# 4 ශ්‍රීලපාහ පුවත්


## රෙසැමේ විවේකාගාරය



4 ශ්‍රීලපාහ රෙජිමේන්තු සැරයන් මේජර් බළලත් නිලධාරී 1 එම්ආර්එම් රම්බණ්ඩාර ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඒකක බළලත් නිලධාරී සහ සැරයන් නිවස්නයේ සියලුම සාමාජිකයින්ගේ මුදල් හා ශ්‍රම දායකත්වයෙන් බනි/සැර නිවස්නයේ පැවති තවත් අඩුපාඩුවක් සපුරා ගැනීමට හැකියාවක් ලැබුනි. ඒකක රෙජිමේන්තු සැරයන් මේජර් වෙත නව විවේකාගාරයක් ඉදි කිරීමට නිවස්නයේ සියලුම සාමාජිකයින්ගේ අප්‍රතිහත ධෛර්යය හා කැපවීම හේතුවෙන් ඉතාමත් කෙටි කාලයක් තුළ හැකි විය. 2013.12.15 වන දින ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහ ගේ සුරතින් උත්සවශ්‍රීයෙන් විවෘත කිරීම සිදු කළේය.

ඒකකයෙන් පිටත රාජකාරි සඳහා යෙදී සිටියද මෙම විවේකාගාරය සඳහා දායකත්වය දැක්වූ සියලුම සාමාජිකයින් මේ මොහොතේ සිහිපත් කරන්නෙමු.

**බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ**



# රෙජිමේන්තු අධිපතිතුමන්ගේ ශ්‍රීලපාහ ඒකක සංචාරය

**ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) බළ ප්‍රදේශයේ සිවිල් ජන ජීවිතයන් ගොඩ නැගීමේ කාර්යයේ යෙදී සිටින 7 ශ්‍රීලපාහ, 10 ශ්‍රීලපාහ, 16(සේව) ශ්‍රීලපාහ, 19 ශ්‍රීලපාහ හා 20 ශ්‍රීලපාහ ඒකකයන් හී සංචාරයක් රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් 2014 මාර්තු මස 15 සිට 18 දින දක්වා සිදු කරන ලදී. එම සංචාරයට රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් සීඩී වීරසූරිය ආර්එස්පී හා රෙජිමේන්තු මාණ්ඩලික ප්‍රධානි කර්නල් ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී මෙන්ම එම බළප්‍රදේශයේ සේනාංකාධිපතිවරු, බළසේනාධිපතිවරු හා ඒකක අණදෙන නිලධාරිවරුන් ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගි වූහ.**

## 7 ශ්‍රීලපාහ ඒකක සංචාරය

7 ශ්‍රීලපාහ ඒකකයට 2014.03.15 දින සුවිශේෂිත වූ දිනක් ලෙසින් සනිටුහන් විය. ඒකකය ආරම්භ කිරීම සමගින් එහි ප්‍රථම දෙවන අණදෙන නිලධාරි මෙන්ම ඒකකය දෙවැන්නට නායකත්ව ලබාදුන් අණදෙන නිලධාරි ලෙසින් රාජකාරි කළ පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සිදු කළ සංචාරය සියලු දෙනාගේ සිත් සතන් හී සනිටුහන් වී ඇත. ඒකක අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් එම්පීඑස්පී කුළසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් රෙජිමේන්තු අධිපති තුමා පිළිගෙන ගන්නා ලදී. ඒකක භටපිරිස් විසින් ලබාදුන් සම්මාන මුරය පිළිගත් රෙජිමේන්තු අධිපති තුමන් මෙතෙක් ඒකකය සමගින් රාජකාරී කරමින් සිටියදී මියගිය රණවිරුවන් සිහිකිරීමට රණවිරු ස්මාරකකයට පුෂ්පෝහාරයෙන් කෘතගුණ දක්වන ලදී. ඉන් අනතුරුව ඒකක මූලස්ථාන කාර්යාලය විවෘත කිරීම සිදු කළේය. ඒකකය සංචාරය සිහිවීමට කඳවුරු භූමියේ අඹ පැළයක් එතුමන් රෝපණය කළේය.

ඒකක බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේ සූදානම් කර තිබූ තේ පැන් සංග්‍රහය භුක්ති විද ඉන් අනතුරුව සියලු භයපිරිස් ඇමතීම සිදු කරන ලදී. නිලධාරි නිවස්නය වෙතින් දිවා ආහාරය ලබාගත් රෙජිමේන්තු අධිපති තුමන් අමුත්තන්ගේ සටහන් තබනා පොතෙහි ඒකකයේ ප්‍රගතිය පිළිබඳව ප්‍රශංසාත්මක සටහනක් තබන ලදී. එදින රාත්‍රියේ උතුරු ප්‍රදේශයේ රාජකාරි කරනු ලබන ශ්‍රීලපාහ රෙජිමේන්තුවට අයත් සියලු නිලධාරීන් සමඟ සුහද හමුවක් පැවැත්වූහ.

**බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ**









## 16 (සෙව්) ශ්‍රීලපාහ ඒකක සංචාරය

කිලිනොච්චි ප්‍රදේශයේ ස්ථානගත 16 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ 2014 මාර්තු මස 15 දින සංචාරය සිදු කළ ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති **මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී තුමන් වෙත ඒකකය විසින් සිදු කරන ලද කාර්යය භාර්යයන් පිළිබඳව දැනුවත් කිරීමක් දෙවන අණදෙන නිලධාරී බීඑම්ටීබී රත්නායක ශ්‍රීලපාහ විසින් සිදු කරන ලදී.** ඒකකයේ භටපිරිස් ඇමතීම සිදු කර ඉන් අනතුරුව ඒකකය වෙතින් ලබාදුන් තේ පැන් සංග්‍රහය භුක්ති විදින ලදී.

**බුද්ධි අංශය 16 (සෙව්) ශ්‍රීලපාහ**







## 10 ශ්‍රීලපාහ ඒකක සංචාරය

10 ශ්‍රීලපාහ ඒකකයේ 2014.03.16 දින සංචාරය කළ රෙජිමේන්තු අධිපති තුමන් පිළිගනු ලැබුයේ ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් කේඩීඑල්සී විජේනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසිනි. අනතුරුව ඒකක භටපිරිස් විසින් කඳවුරු සම්මාන මුරයක් පිරිනමන ලදී. ඒකකයේ සියලුම නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨකොනොනීන් හඳුනාගැනීමෙන් පසු රෙජිමේන්තු අධිපති තුමන් සංචාරය සිහිවීමට කඳවුරු භූමියේ අඹ පැළයක් රෝපණය කළේය.

ඒකකයේ ඉදිකර තිබූ අංග සම්පූර්ණ කොනොනි සමාජ ශාලාව යෙදුන සුබ මොහොතින් විවෘත කිරීමෙන් පසු අණදෙන නිලධාරී විසින් සමරු පලකයක් රෙජිමේන්තු අධිපති තුමන් හට පිරිනමන ලදී.

සියලුම නිලයින් සමඟ සුහදශීලිව කතාබස් කර ඔවුන් විසින් ප්‍රදේශයේ සිදු කරනු ලබන රාජකාරීන් හා සුබසාධන කටයුතු පිළිබඳවද කරුණු විමසීමට අමතක නොකරන ලදී. අනතුරුව කඳවුරු භූමියේ සංචාරය කර ඒකකයේ අනාගත අභිවෘද්ධිය උදෙසා සිදු කළ යුතු දෑ පිළිබඳව උපදෙස් ලබාදෙන ලදී. නිලධාරී නිවස්නයේ පැවැති තේ පැන් සංග්‍රහය භුක්ති විඳ ඒකක සමරු සටහන් පොතෙහි සමරු සටහනක් තබා මෙම ඒකක සංචාරය අවසන් කර නික්ම යන ලදී.







**බුද්ධි අංශය 10 ශ්‍රීලපාහ**



## 19 ශ්‍රීලපාහ ඒකක සංචාරය

මුලංකාවිල් ප්‍රදේශයේ සිවිල් ජන ජීවිතය නගා සිටුවීමේ රාජකාරි සිදු කරන 19 ශ්‍රීලපාහ ඒකකයේ ද 2014 මාර්තු මස 16 දින ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීජී කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සංචාරයක් සිදු කළේය.

එහිදී ඉදිවමින් පවතින කඳවුරු පරිශ්‍රය සැබැදිව අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ටීඑන්කේ පෙරේරා ශ්‍රීලපාහ විසින් පැහැදිලි කිරීමක් කරන ලදී. ඉන් අනතුරුව රෙජිමේන්තු අධිපති තුමා විසින් සියලු නිලයින් ඇමතීම සිදු කළහ. ඒකකයේ නිලධාරීන් හා ජ්‍යෙකොනොනින් සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටීමටද අමතක කළේ නැත. ඒකකය වෙතින් ලබාදුන් තේ පැන් සංග්‍රහය භුක්ති විදීමෙන් පසු අමුත්තන්ගේ පොතහී සනිටුහනක් සිදු කර සංචාරය නිමාකර කඳවුරෙන් පිටත්ව යනව ලදී.

බුද්ධි අංශය 19 ශ්‍රීලපාහ







## 20 ශ්‍රීලපාහ

පුනරින් මුක්කම්පන් ප්‍රදේශයේ ස්ථානගත 20 ශ්‍රීලපාහ ඒකක මූලස්ථානය 2014 මාර්තු මස 16 දින යෙදුණු සුබ මොහොතින් 1004 පැයට ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති **මේජර් ජෙනරාල් කේඒඩීජී කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින්** විවෘත කළේය. ඉන් අනතුරුව කඳවුරු භූමියේ නා ගසක් රෝපණය කර වායු සමීකරණය කරන ලද කොනොනි සමාජ ශාලාව විවෘත කිරීමද සිදු කළේය.

ඒකකයේ සියලුම නිලයින් අමතා ඒකක අණදෙන නිලධාරිගේ අධිෂ්ඨානය, කැපවීම, මඟ පෙන්වීම තුළින් සියලු නිලධාරි සහ සෙසුනිලයින්ගේ කැපවීම හා ශ්‍රමදායකත්වයෙන් කෙටි කාලයක් තුළ සිදු කරන ලද විශිෂ්ට මෙහෙය සමස්ත යුද හමුදාවට මහඟු ආදර්ශයක් බවත්, ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට ඉමහත් වූ ආඩම්බරයක් හා අභිමානයක් බවත් පවසන ලදී.

ස්ථිර කඳවුරක් 20 ශ්‍රීලපාහ ඒකකයට ගොඩනැංවීමේ මූලිකත්වය ගෙන කටයුතු කළ අණදෙන නිලධාරි ලුතිතන්




කර්නල් අයිපී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ, ඇතුලු සියලුම නිලයින්ටත්, විවිධ අන්දමින් මෙය ගොඩනැන්වීම සඳහා සහය ලබාදුන් සියලුම දෙනා වෙත ඒකකයේ සියලුම දෙනාගේ හෘදයාංගම ස්තුතිය පුද කරන්නෙමු.

බුද්ධි අංශය 20 ශ්‍රීලපාහ



# ලෙබනන් රාජ්‍යයේ සංචාරය කළ පාබල හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරි



ලෙබනන් සාමසාධක රාජකාරි සඳහා සේවය කරනු ලැබූ ශ්‍රී ලංකා පාබල හමුදා සාමාජිකයින් ගේ සුවදුක් සොයා බැලීම සඳහා ලෙබනන් රාජ්‍යයේ බ්‍රිගේඩියර් එච්එම්ජේකේ ගුණරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී සංචාරයක් සිදුකරන ලදී. එම සංචාරයේදී ඉන්දියන් රාජ්‍යයෙන් සාමසාධක රාජකාරි කරනු ලබන නවවන සික් පාබල හමුදා බළඇණියේ පැවති 65වන ඉන්දියන් ජනරජ සම්මාන පෙළපාළියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් සහභාගි විය. එය ශ්‍රී ලංකා යුද හමුදා ජ්‍යෂ්ඨ නිලධාරියෙකු හට ලැබෙනා දුර්ලභ අවස්ථාවකි.







2014 මාර්තු මස 10 දින පළමු උපන් දිනය සැමරූ 7 ශ්‍රීලපාහ සෙ/301382 කෝප්‍රල් රණසිංහ ඩබ්ලිව්ටීපීවන් ගේ පුතණුවන් ගසිඳු ඉඳුවර ඔෂාන්






2014 පෙබරවාරි මස 24 දින පළමු උපන් දිනය සැමරූ රෙජිමුබ ශ්‍රීලපාහ සෙ/21ඩී00065 ලාකෝ චන්දන කුමාර බීඑම් ගේ දියණිය සදිසි කෞෂල්‍යා






15 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/324227 කෝප්‍රල් වික්‍රමආරච්චි ඩබ්ලිව්ඒඑස්කේ 2014 ජනවාරි මස 16 මානෙල් රාජපක්ෂ මෙනවිය සමඟ වාසනාවන්ත විවාහ දිවියට පා තබන ලදි

# 11 ශ්‍රීලපාහ පුවත්

# නව බුද්ධ මන්දිරයක්





11 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට මහත් අඩුපාඩුවක් ව තිබූ බුදු මැදුරක් 2014.01.23 වන දින පෙරවරු 1045 ට එළඹුන සුබ මොහොතින් බුද්ධාලම්බමන ප්‍රීතියන් මැද්දේ නව පිළිම වහන්සේ තැම්පත් කරන ලදී. තවද ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් වීඩීඑස් පෙරේරා ශ්‍රීලපාහ සහ ඒකකයේ සියලුම නිලධාරින් සහ සෙසුනිලයින්ගේ ශ්‍රමදායකත්වයෙන් හා ඒකකයේ හිටපු අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ මග පෙන්විම මත දානපති සුදත් තෙන්නකෝන් මහතාගේ ධන පරිත්‍යාගයෙන් මෙම බුදුමැදුර ඉදි කරන ලදී. එදින මහා සංඝයා වහන්සේලා වඩම්මවා ධර්ම දේශණාවක් සංගායනා කරන ලදී. ඒකකයේ හිටපු අණදෙන නිළධාරි හා ධානපති සුදත් තෙන්නකොන් මහතා හා ඒකකයේ ධීශ්‍රාම ගොස් සිඩින ඩේජර් ඩිසීඑල් විතාන ශ්‍රීලපාහ ද මේ සඳහා පැමිණෙන ලදී. ඒකකය වෙනුවෙන් සිදු කළ මෙම සත් ක්‍රියාව වෙනුවෙන් සුගත් තෙන්නකොන් මහතාට සමරු ඵලකයක් ද ඒකක අණදෙන නිලධාරි විසින් ප්‍රදානය කරන ලදී. අණදෙන නිලධාරි ඇතුලු සියලුම අයවලුන් හට ත්‍රිවිධ රත්නත්‍රයේ පිහිට ලැබේවා ! යැයි ප්‍රාර්ථනා කරන්නේමු.

**11 ශ්‍රීලපාහ - බුද්ධි අංශය**

# උගන්ඩා ආරක්ෂක ලේකම් ගේ යාපනයේ සංචාරය

11 ශ්‍රීලපාහ ඒකකය යාපනය අර්ධද්විපයේ කරෙයි නගර් ප්‍රදේශයෙ රාජකාරි සිදු කරමින් සිටියදී ඒකකය වෙත සුවිශේෂි අවස්ථාවක් උදා විය. උගන්ඩා රාජ්‍යයේ ආරක්ෂක ලේකම් ජෙනරාල් ඔඩංගෝ ජේජේ (GENERAL ODONGO JEJE) යාපනය ප්‍රදේශයේ සංචාරය සිදු කළ අතර, එහිදී 11 ශ්‍රීලපාහ ඒකකය වෙත ^ න ' එතුමන් හට ආරක්ෂක සේනා මු ල ස' ථා න ය



(යාපනය) හීදී සම්මාන මුරයක් ලබා දෙන ලදී.

අණදෙන නිලධාරි ගේ හා රෙජිමේන්තු සැරයන් මේජර් ගේ පූර්ණ අධීක්ෂනය යටතේ මෙම සම්මාන මුරය ලබාදීමට කටයුතු කරන ලදී.

**11 ශ්‍රීලපාහ - බුද්ධි අංශය**

# HOW TO BE A LEADER WITH AN EXTRAORDINARY LIFE?



Being an extraordinary person requires intense effort, and it is something that you to strive for in your lives your personal lives, your family lives, your organizational lives, and your community lives. It requires at least the following eleven major commitments.

**BE COMMITTED TO A NEVER - ENDING SEARCH FOR TRUTH.**

This seems obvious, and each of us will tell ourselves that we do this all the time. Yet, if you look closely at behavior, few human beings actually do this more than 50% ofthe time in our lives. Most of us run from truth when we are frightened, when it promises emotional or psychic pain,and most of the time we don't even know that we are frightened or that we are runningaway from the truth. This behavior is hard wired into the neurobiological structure of the brain. But it can be overcome. The message is the same as that for physical conditioning,no pain, no gain. And here the pain comes from forcing ourselves to move toward thesource of emotional or psychic pain each day in our lives.

**TAKE PERSONAL RESPONSIBILITY FOR THE PROBLEMS IN YOUR LIFE**

When we make a list of the causes of the problems in our life, we should start that list with the simple word, ME. Ask yourself how often you or those around you do this.More frequently the first thing on the list is THEY, IT, or THEM, not me. This simple change is empowering, because I can change me, while it is difficult or impossible to change They, It, or Them.

**BE COMMITTED TO DELAYING GRATIFICATION**

By delaying gratification we create investment, we gain patience, we become enabling to those around us. Delaying gratification also means that we incur pain earlier, whether it is from stopping the procrastination that is a part of almost all our lives or by facing up to difficult personal, family, or business issues earlier rather than later.

**BE A PERSON OF HONESTY AND INTEGRITY**

This means you operate within the rules of the game you are in, you are clearabout the principles of your life, you live up to them, and you respect and honor yourwords and your declarations.Virtually no one can be in total integrity at all times. But being a person of integrity, you recognize immediately when you are out of integrity, and you take responsibility for, and clean up, whatever mess you have created.We often justify being out of integrity because it is too costly to us. But it is important to recognize that integrity and honesty are most valuable to ourselves and others only when it costs us something to honor these principles.

**BE SOMEONE WHO IS ENROLLABLE IN LIFE**

This means you are always the possibility of yes. You do not always say yes, but you are the possibility of yes. You let the world and the opportunities it presents into yourlife. You are both enrollable and enrolling, in that you bring opportunities and possibilities to others. It is easy to see the stilting effect that one person who is not open to change and innovation can have on his or her associates, whether it is in the community, workplace, or family. Such a person is not a leader.

( Conted.... Issue Nexs)

**K.A.DARSHANA LAKMAL**
**EASTERN UNIVERSITY, SRI LANKA**

# 7 ශ්‍රීලපාහ පුවත්

# ප්‍රජා සත්කාර

**"මිනිසාට උදවු උපකාර කිරීමට නිල, තානාන්තර, උස්මිටි භේදයන් හෝ ජාති භේද කිසිවක් නැත. සිදු විය යුත්තේ උදවු උපකාර කරන්නා හදපත්ලෙන්ම නැගෙන්නා වූ සිතුවිලි යහපත් චේතනාවෙන් යුක්තව ඉටු කිරීමයි."** මෙවැනි උතුම් වූ පාරිශුද්ධ චේතනාවෙන් යුක්තව ප්‍රජා සත්කාරයක් 7 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුළසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ මග පෙන්වීම යටතේ නොබෝදා සිදු කරන ලදී.



කිලිනොච්චි ප්‍රදේශයේ ස්ථානගත ඒකක බළප්‍රදේශයට අයත් ජයන්තිනගර් ග්‍රාම සේවා වසමේ පදිංචි ඉතා දිළිඳු පවුලක් වන මුරුගන් ගුණසීලන් මහතා ඇතුලු පස් දෙනෙකුගෙන් සමන්විත නිවැසියන් සඳහා වැසිකිලියක් සදා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. ඉන්පසුව ඒ පිළිබඳව සොයා බැලීමේදී මොවුන් ඉතා අන්ත අසරණ දිළිඳු පවුලක් හා මිනිස් වාසයට නුසුදුසු පුංචිම පුංචි කුඩා පැල්පතක ජීවත් වන බවත්, ඔවුන්ගේ දියණියන්ගෙන් බාල දියණියගේ වකුගඩු දෙකම අක්‍රිය වී ලේ පිළිකාවකින් ද පෙළෙන ඉතා අන්ත අසරණ පවුලක් බැව් අනාවරණය වන ලදී.





'මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීම' යන උදෘත පාඨය සනාත කරමින් ඒකකයේ නිලධාරින් හා සෙසුනිලයින්ගේ මුල්‍ය හා ශ්‍රම දායකත්වයෙන් අණදෙන නිලධාගේ අධීක්ෂණය යටතේ මසක් ඇතුළත රුපියල් ලක්ෂ හතර හමාරක ( රුපියල් 450,000.00 ) වටිනා කමකින් යුතු නව නිවසක් සහ වැසිකිළියක් සාදා නිම කරන ලදී. මෙම නිවස ඉදිකිරීමට මුල්‍ය පරිත්‍යාග යක ශ්‍රී ලංකා ටෙලිකොම් නව සම්බන්ධතා අංශයේ ප්‍රධාන කළමනාකාර ලයනල් ඉඹුලාන මහතා විසින් සිදු කළේය.

වර්ෂ 2014 ක්වූ ජනවාරි මස 03 වන දින ආසේමු (කිළි) ආඥාපතගේ සුරතින් නිවසට ඇවැසි අත්‍යවශ්‍ය බඩු භාහිරාදිය සමඟ නවතමයෙන් ඉදි කරන ලද නව නිවස නිවැසියන් හට පිරිනමන ලදී. වසර ගණනාවකට පසු ලද තිරසාර සාමකාමී වතාවරණයෙන් පසුවන අවධියක මෙවැනි සත්පුරුෂ ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන් එම අවස්ථාවට සහභාගි වී සිටි සියලුම දමිළ වැසියන් කෘතවේදිත්ව දැසින් යුතුව බලා සිටියහ. එම මොහොතේ නිවැසියන්ගේ නෙතින් වැටුණු සතුටු කඳුළු ඔවුන්ගේ සිත් උද්දාමයට පත් වී තිබූ බව පැහැදිලිව පෙණුනි.

ඉතා සුලු අරමුණකට පවා මිනිසුන් මරා ගන්නා අසත්පුරුෂයන් බහුලව ජීවත් වන අප සමාජය තුළ කිසිදු ජාති භේදයකින් තොරව යහපත් චේතනාවෙන් යුක්තව මෙවැනි සත් පුරුෂ ක්‍රියාවන් ගොඩනැංවීමෙහිලා පෙරමුණ ගෙන ක්‍රියා කළ අණදෙන නිලධාරි ඇතුලු ඒකකයේ සියලුම අයවළුන්, ටෙලිකොම් ආයතනයේ ලයනල් ඉඹුලාන මහතා ඇතුලු පවුලේ සැම වෙත ගම්වාසින් විසින් ඔවුන්ගේ භක්ති ප්‍රණාමය පුදකරන ලදී.

**බුද්ධි අංශය - 7 ශ්‍රීලපාහ**



# 15 ශ්‍රීලපාහ පුවත්

# බළඇණි දින සංවත්සරය



වර්ෂ 2008 ක්වූ ජනවාරි මස 03 වන දින පෙරවරු 1027 ට යෙදුනු සුබ මොහොතින් රෙජිමේන්තු මධ්‍යස්ථානය පනාගොඩ හීදී වත්ති මානුෂිය මෙහෙයුමට දායකත්වය ලබාදීම සඳහා 15 ශ්‍රීලපාහ ඒකකය නැවත ස්ථාපනය කරන ලදී. පුරා හය වසක් උතුරු නැගෙනහිර ප්‍රදේශයන් හී රාජකාරි ඉටුකර ඇති මෙම ඒකකය දනට 224 බළසේනා මූලස්ථානය යටතේ කින්නියා හා තඹලගමුව ප්‍රදේශයන් හී රාජකාරි ඉටු කරනු ලබයි.

ඒකක හයවන සංවත්සරය සැමරීම ආරම්භ කරමින් 2014 ජනවාරි මස 02 දින වරු පිරිතක් ඒකක මූලස්ථාන කඳවුරේ දී සිදු කරන ලදී. 2014 ජනවාරි මස 03 දින අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් පිරිනැමීම ද සිදු විය. ඉන්පසු ආගමික වතාවත් වලට මුල් තැන දෙමින් අභිනවයෙන් ඉදි කළ බුදු මැදුර වෙත බුදුපිළිම වහන්සේ නමක් වැඩම කරවා තැන්පත් කිරීම සිදු කරන ලදී. ඒකකය වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් 65 දෙනා හට නිවන්සුව ප්‍රාර්ථනා කරමින් දහවල් මහා සංඝයා වහන්සේ දෙතිස් නමක් විෂයෙහි අෂ්ඨ පරිස්කාර





සහිත සංඝගත දක්ෂිනාවක් පිළිගැන්විණි. අණදෙන නිලධාරි විසින් සියලුම අයවළුන් ඇමතීමද මෙහිදී සිදු කරන ලදී.

බළඇණි දිනයේදී ඒකකය වෙනුවෙන් දිවිදුන් විරුවන් අනුස්මරණය කිරීම උදෙසා **"විජයග්‍රහනයේ පරිෂ්ඨය"** **"VICTORY CORRIDOR"** ලෙස නම් කරන ලද දේශන ශාලාවේ සියලුම අංගයන්ගෙන් සපිරුනු සියලු නිල භෝජන සංග්‍රහයක් පැවැත්වීමට කටයුතු සිදු කළේය. එදින සවස් කාලයේ සියලු



නිලයින්ගේ විනෝදාස්වාදය සඳහා සංගීත සැදෑවක් ද පවත්වන ලදී.

2014 ජනවාරි මස 08 දින බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේ සුහද හමුවක් සංවිධානය කර තිබූ අතර, ඒ සඳහා ඒකකය ආරම්භයේ සිට සේවය කළ ජ්‍යෙකොනොතින් විශාල පිරිසක් සහභාගි වූහ.

විසිදෙවන සේනාංක බල ප්‍රදේශයේ ස්ථානගත පාබල ඒකකයන් හී ජ්‍යෙෂ්ඨතම බළඇණිය වශයෙන් මෙම ඒකකය ඉතා සාර්ථකව සිය හයවන බළඇණි දින සංවත්සරය සිදු කරන ලදී. මෙය සාර්ථකව සිදු කර ගැනීමට දායක වූ සැමදෙනාට හද පිරි ප්‍රණාමය පුද කරන අතර, ඉදිරියේදී පාබල රෙජිමේන්තුවේ විශිෂ්ට බළඇණියක් වශයෙන් පෙරට ඒමට ඇවසි ශක්තිය හා ධෛර්යය නිරතුරුව ලැබේවායි යන්න අප සැමගේ ප්‍රාර්ථනයයි.

**15 ශ්‍රීලපාහ - බුද්ධි අංශය**

# 24 ශ්‍රීලපාහ පුවත්

## ප්‍රජා සත්කාර

24 ශ්‍රීලපාහ දනට ග්‍රාම නිලධාරි වසම් 21ක ජීවක් වන සිංහල දමිළ හා මුස්ලිම් වැසියන් ගේ සුබසාධක කටයුතු ඉටු කරමින් 213 වන බළසේනා මූලස්ථානය යටතේ සෙට්ටිකුළම් ප්‍රාදේශිය කොට්ඨාශයේ රාජකාරි කරනු ලබයි.

213 බළසේනාධිපති කර්නල් එච්එම්ඩබ්ලිව්කේ හේරත් ආර්ඩබ්ලිව්පී ගේ මඟ පෙන්වීමෙන් ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස්එන්එම්ජ්බී අරඹේපොළ ශ්‍රීලපාහ ගේ උපදෙස් මත නිලධාරි අණදෙනවරුන්ගේ සහයෝගය ඇතිව ප්‍රදේශයේ ඉගෙනුම ලබන දූ දරුවන් වෙනුවෙන් ප්‍රජා සත්කාරයන් සිදු කරනු ලැබූහ. 2013 වර්ෂයේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ හා වැඩිම ලකුණු ලබාගත් දූ පුතුන් වෙනුවෙන් තම්මැන්නා ඇලවක විද්‍යාලයේදී ත්‍යාග ප්‍රදානෝත්සවයක් 2013 නොවැම්බර් මස 27 දින පවත්වන ලදී. මෙම සුවිශේෂ අවස්ථාවට 21 සේනාංකාධිපති මෙන්ම ජ්‍යෂ්ඨ නිලධාරීන් හා ප්‍රදේශයේ ප්‍රභූවරුන් සහභාගි විය. එහිදී පාසැල් බෑග්, පාසැල් පොත්, පුස්තකාය සඳහා පොත්, ක්‍රීඩා උපකරණ හා වෙනත් පාසැල් උපකරන බෙදාදීම සිදු කරන ලදී. මෙම පරිත්‍යාගයන් සඳහා 213 බළසේනාවෙන් හා සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ සේවක මණ්ඩලයේ අනුග්‍රහයෙන් රුපියල් ලක්‍ෂ පහකට අධික ත්‍යාග ලබාදීමට හැකිවිය. මෙම සත් කාර්යය උත්සවයට පැමිණි ප්‍රදේශයේ විවිධ ජාතීන්ගේ පැසසුමට ද ලක් විය.





## ක්‍රීඩා තරුවක්



සෙ/328960
සාසෙ අජන්ත කුමාර ඕ

2010 වර්ෂයේ ආසෙමු(ව) යටතේ ස්ථාපිත ඒකකය අතර, පැවති මල්ලව පොර ක්‍රීඩා තරඟාවලිය සඳහා මෙම ඒකකයේ සෙ/328960 සාසෙ අජන්ත කුමාර ඕ ආධුනික තරඟකරුවෙකු ලෙසින් සහභාගි වී එහිදී කිංග්‍රෑ: 84 බර පන්තියෙන් රන් පදක්කමක් හිමි කරගනිමින් මල්ලව පොර ක්‍රීඩාවට අවතීර්ණ විය. ඉන් පසු අණදෙන නිලධාරිගේ මඟ පෙන්වීමෙන් හා රෙම ශ්‍රීලපාහ ක්‍රීඩා අංශයේ දිරි ගැන්වීමෙන් පුහුණුවීම සිදු කර දනට ජයග්‍රහන රාශියක් හිමි කර ගනිමින් ඒකකයටත් රෙජිමේන්තුවටත් පොදුවේ යුද හමුදාවටත් කීර්තියක් ගෙන දීමට කටයුතු සිදු කර ඇත.

2010 - ආසෙමු (ව) තරඟාවලියේදී රන් පදක්කම, 2011 - අන්තර් පළාත් තරඟාවලියේදී රිදී පදක්කම, 2012 - අන්තර් පළාත් තරඟාවලියේදී රන් පදක්කම, 2012 - අන්තර් රෙජිමේන්තු තරඟාවලියේදී රන් පදක්කම, 2012 - ශ්‍රී ලංකා ආධුනික මල්ලව පොර තරඟාවලියේදී රන් පදක්කම, 2012 - අන්තර් රෙජිමේන්තු ජූඩෝ තරඟාවලියේදී ලෝකඩ පදක්කම හා 2013 වර්ෂයේ පැවති ත්‍රිවිධ හමුදා මල්ලව පොර තරඟාවලියේදී ලෝකඩ පදක්කම් හිමි කර ගැනීමෙන් දක්‍ෂතා දක්වා ඇත.

ගෙවී ගිය සීමිත කාලසීමාවකදී මෙවන් දස්කම් දක්වූ මෙම ක්‍රීඩකයාට තව තවත් ජයග්‍රහන ලබාගෙන ඒකකයට, රෙජිමේන්තුවට, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හා සමස්ත ශ්‍රී ලංකාවට කීර්තියක් රැගෙන ඒමට හා රනින් බැබලවීමට ඇවසි ශක්තිය හා ධෛර්යය නිරතුරුවම ලබේවා යි යන්න අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලයින්ගේ සුබපැතුම් එක් කරන්නෙමු.




## රුක් රෝපණය

රන්කොත් ගම්මානයේ නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර තුර 2013 දෙසැම්බර් මස 21 දින 213 බළසේනාධිපතිගේ මඟ පෙන්වීමෙන් ඒකක අණදෙන නිලධාරිගේ හා අනිකුත් අයවලුන්ගේ සංවිධාන ශක්තියෙන් වන සංරක්‍ෂන දෙපාර්තුමේන්තුවේ සහයෝග යෙන් ප්‍රදේශයේ ජනයා දනුවත් කර රුක් රෝපණයට පැල බෙදාදීම සිදු කරන ලදී.

බුද්ධි අංශය - 24 ශ්‍රීලපාහ



# අටවන කණ්ඩුලගේ සම්ප්‍රාප්තිය

ශ්‍රී ලංකා පාබල හමුදාවේ ප්‍රතාපවත් බවත්, අභිමානය නිරූපණය කිරීමට මංගල මූර්තිය ලෙසින් හා රණශූර දුටු ගැමුණු නිරිඳුන්ගේ රාජකීය හස්තියාට ප්‍රණාමයක් ලෙසින් පළමුවන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ලෙසින් කටයුතු කළ කර්නල් රිචඩ් උඩුගම විසින් ඇත් පැටවකු තෝරාග ත්නා ලදී. 1961 ජනවාරි මස 02 වන දින දෙහිවල සත්ත්වෝද්‍යානය වෙතින් ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත හිමි වූ කුඩා ඇත් පැටවා කණ්ඩුල ලෙස නම් කර රෙජිමේන්තු මංගල සංකේතය බවට පත් කර ගන්නා ලදී.

කණ්ඩුල I 1961 ජනවාරි මස 02 දින සිට 1967 ජුනි 26 දින දක්වා ශ්‍රී ලංකා පාබල හමුදාවට සේවය කර ඇති අතර, එම කාලසීමාවේදී 1963, 1964 හා 1965 වසරවල්හී නිදහස් දින පෙළපාළි, 1966 පෙබරවාරි මස 10 දින බුරුම රාජ්‍ය නායකයා වෙත, 1966 ජූලි 08 දින ආණ්ඩුකාර උතුමානන් වෙත හා 1966 සැප්තැම්බර් මස 12 වන දින ගරු අග්‍රාමාත්‍යතුමිය වෙත ලබාදුන් සම්මාන මුර, පෙළපාළි යන විශේෂ උත්සව අවස්ථාවන් වලදී සේවාවන් ලබාදී ඇත. 1967 ජුනි 26 දින පනාගොඩ පාබල හමුදා සාමාජිකයින්ගේ සමුදීමේ ආචාර පෙළපාළි පිළිගැනීමෙන් පසු දෙහිවල සත්ත්වෝද්‍යානය වෙත ලබාදෙන ලදී. පළමු කණ්ඩුගේ සමුදීමෙන් පසු 1967 අගෝස්තු මස 04 දින දෙවන කණ්ඩුලගේ සේවය ලබාගත් පාබල හමුදාව 1984 මාර්තු මස 01 දින දක්වා සේවය කර ඇත. දෙවන කණ්ඩුල සේවය කරන අතරතුර තෙවන කණ්ඩුල ගේ සේවය ලබාගැනීමට පාබල හමුදාව 1976 මාර්තු මස 02 දින සිට 1976 අප්‍රේල් මස 12 දින දක්වා උත්සහ කළත් තෙවන කණ්ඩුලට වැළඳුනු රෝගයක් හේතුවෙන් මියයන ලදී. සිව්වන කණ්ඩුල දෙවන කණ්ඩුලගේ සමුදීමේ උත්සවයට සහභාගි වී කණ්ඩුල IV ලෙසින් අභිෂේක ලැබීය. ඔහුගේ සේවාකාලය 1993 අගෝස්තු මස 11 දිනෙන් නිමාවට පත්විය. ඉන් පසු මෙම කණ්ඩුල පරපුරට එක් වූයේ පස්වන කණ්ඩුලය. ඔහුගේ සේවා කාලයද 2002 නොවැම්බර් මස 18 දිනෙන් අවසන් විය. 2001 දෙසැම්බර් මස 12 දින පාබල හමුදා සෙවන වෙත පැමිණි හයවන කණ්ඩුලගේ සේවය 2009 මැයි මස 20 දින දක්වා ලබාගැනීමට හැකිවිය. 2009 මැයි මස පස්වන දින පනාගොඩ කඳවුරට රැගෙන ආ කණ්ඩුල පරපුරේ හත්වැන්නා වර්තමානයේ රෙජිමේන්තු හස්තියා ලෙසින් වැජඹෙන අතර, කණ්ඩුල පරපුරේ පනස්වන සංවත්සර උත්සවය වෙනුවෙන් ගරු බුහුමන් ලැබීමට තරම් වාසනාවන්ත විය. හත්වන කණ්ඩුලගේ සේවය ලබාගන්නා අතරතුර අටවන කණ්ඩුලගේ සම්ප්‍රාප්තිය 2014 ජනවාරි මස 29 වන දින සිදු විය. මීට වසර තුනහමාරකට පෙර උඩවලව වනෝද්‍යානයේ උපත ලද මෙම ඇත් පැටවා මවගේ රැකවරණයෙන් මිදීමෙන් පසු කැලයේ අතරමංව සිටියදී වනජීවී නිලධාරීන්ට හමු වී ඇත. ඉන්පසු මෙම ඇත් පැටවා උඩවලව ඇත් අතුරු සෙවනේ ඇති දූඩි වී ඇත්තේ 'රැකටී' නමිනි. 2014 ජනවාරි මස 29 වන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ උතුමානන්ගේ සුරතින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිතුමන් වෙත ලබාදුන් කුඩා ඇත් පැටවා පාබල හමුදා රෙජිමේන්තුවේ අටවන කණ්ඩුල ලෙසින් අභිෂේක ලබන්නේය.

අතිකුත් කණ්ඩුල පරපුරේ කාර්යයන් වෙත හුරුවී රෙජිමේන්තු මංගල හස්ථියා ලෙසින් තූර්ය වාදන හඬ නිවැරදිව පා තැබීම, හොඬය උස්සා ආචාර සමාචාර කිරීම පුරුදු පුහුණු වී ශ්‍රී ලංකා පාබල හමුදාවට අභිමානයක් ගෙනදීමට හැකියාව ලැබේවායි යන්න අප ප්‍රාර්ථනා කරන්නෙමු.

## සෙබළ සිත

රුදුරු යුද්දය නිමාවීමත් සමග
සියල්ල සේම අපටද නිදහස ලැබුනි යැයි
සිතුනි මට
එහෙත් උතුරු දකුණ සියල්ල නිදහස් වුවත්
ජාත්‍යන්තර බලවේග හා නොයෙකුත් හේතු
කොටගෙන
යුද්ධයකට වඩා ශ්‍රමයක් අප දරමු අද
එසේ වීමට හේතුව කුමක් දැයි
නොදැනේය මම

ලාකෝ උදයප්‍රිය ඩබ්ජීජ්ජ්එස්
බී කණ්ඩායම 19 ශ්‍රීලපාහ

## රකිමු සදා...

ශ්‍රී විභූෂිත ලංකාවේ අපි
ළය ඇති බිය නැති
පාබල විරුවන් වෙමු සැමදා
හඳුනාගනිමින් සතුරන් වනසමු
අප රට පණමෙන් රකිමු සදා..

ලාකෝ විමලරත්න එම්ජ්සීඑන්
බී කණ්ඩායම - 15 ශ්‍රීලපාහ

## හැරගිය ඔබ

මට නොකියා යන වග
දුක කියලා හොදටම
යන්න ගියේ ඇයි දෝ ඔබ
හඩන දෙනුවන් කකියන
රිදුම' දෙයි පපුව මතට
ප්‍රේමයක් යලි නොවිඳිනා
හදවතක් ඇත මම ලග

කෝප්‍රල් ප්‍රේමරත්න පීඩබ්එල්ඩී
26 ශ්‍රීලපාහ - ඩී කණ්ඩායම

## විරුදරු සිතුවම්

### හෙළයේ මහ ගත්කරු



චාලක ඩිල්ෂාන් රත්නායක
8 බී ශ්‍රේණිය
පල්ලෙවෙල මධ්‍යම මහ විදුහල
පල්ලෙවෙල

### ගමක අසිරිය



බිමල්ක ෂෙහාන් රත්නායක
3 සී ශ්‍රේණිය
මිනු/බ/ ශ්‍රී දේවරක්ෂිත ප්‍රාථමික විදුහල
වල්බෝලාන - පල්ලෙවෙල

26 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/330555 සැරයන් රත්නායක එන්ටී ගේ පුතුණුවන්

# ශ්‍රීලපාහ රණවිරු සංසදය පිහිටවූ වගයි...







ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිතුමාගේ සංකල්පයකට අනුව මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට සුබසාධනය සිදු කිරීම සඳහා ඔවුන් එක්රැස් කර රණවිරු සංසදයක් පිහිටවීමට උපදෙස් ලැබුනි. ඒ අනුව ශ්‍රී ලංකා පාබල හමුදා මධ්‍යස්ථා සේනාවිධියක කර්නල් සීඩී වීරසූරිය ආර්එස්පී ගේ මූලිකත්වයෙන් 2014 ජනවාරි මස 22 වන දින පනාගොඩ බෝධිරාජාරාමයේදී ශ්‍රීලපාහ රණවිරු සංසදය පිහිටුවීමට කටයුතු කරන ලදී.

මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් 2529 දෙනෙකු මේ සඳහා පැමිණි අතර, ඔවුන් අතුරින්ම සංසදයේ උපදේශක කමිටුව හා විධායක කමිටුව තෝරාපත්කර ගන්නා ලදී.

මෙසේ ස්ථාපනය වූ ශ්‍රීලපාහ රණවිරු සංසදය මියගිය රණවිරුවන්ගේ ඥාතීන්ගේ සුබසාධනය වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටු කිරීමට හැකි අතර, එකිනෙකා අතර පවතින බැඳීම තව තවත් වර්ධනය වන්නේය.

ශ්‍රීලපාහ රණවිරු සංසදය දිනෙන් දින සාර්ථකත්වය පැමිනේවා යි අප සැම සුබ ප්‍රාර්ථනා එක් කරන්නෙමු.

## උපදේශක කමිටුව

| | |
|---|---|
| කපිතන් එස් කුමාර (විශ්‍රාමික) | (මේජර් ජෙනරාල් සීඑල් විජේරත්න ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී එම්බිපීඑම් ගේ සොහොයුරා) |
| සිපී පුංචිහේවා | (ලුතිතන් කර්නල් සීකේජී පුංචිහේවා ආර්එස්පී ගේ බිරිඳ) |
| ආර් පිරිස් | (ලුතිතන් කර්නල් එම්ජ් පිරිස් ආර්එස්පී ගේ බිරිඳ) |
| ඒඩීවී විජේසිංහ | (ලුතිතන් කර්නල් ඩීඩබ් විජේසිංහ ආර්එස්පී ගේ බිරිඳ) |
| එච්බී ද ලැනරෝල් | ( ලුතිතන් කර්නල් ඩීවි ද ලැනරෝල් ආර්ඩබ්පී ආර්එස්පී ගේ බිරිඳ |







## විධායක කමිටුව

| | |
|---|---|
| සභාපති | ඒපී මහිපාල (කපිතන් බිජ් මහිපාල ගේ පියා) |
| උප සභාපති | ඒකේ ආරච්චි (සැරයන් ආරච්චි කේකේඒපීකේ ගේ පියා) |
| ලේකම් | ජීර් ජයවර්ධන (ලාකෝ වලහගොඩ කේඩබ්ජීජීකේ ගේ සොහොයුරා) |
| උප ලේකම් | කේ මාමඩවිලගේ ( සැරයන් තිලකරත්න එම් ගේ බිරිඳ) |
| භාණ්ඩාගාරික | ඩබ්ජ් ප්‍රේමවති (සැරයන් ලියනගම ඒඑල්එස්ආර් ගේ මව) |
| උප භාණ්ඩාගාරික | වයි ජමල්ඩින් ( මේජර් එම්එන් ජමල්ඩින් ආර්ඩබ්පී ආර්එස්පී ගේ බිරිඳ) |



# Happy Birth day



2014 පෙබරවාරි මස 17 දින පස්වන උපන් දිනය සැමරූ 4 ශ්‍රීලපාහ සෙ/320860 කෝප්‍රල් පත්මකුමාර ඒඩබ්එස් ගේ පුතුණුවන් කවීන් නෙරන්ජන්



2014 මාර්තු මස 28 වන දින පළමු උපන් දිනය සමරන1 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/325598 කෝප්‍රල් ප්‍රදීප් කුමාර එපී ගේ දියණිය වන සවේජා ගිත්සිලූණි



2014 ජනවාරි මස 25 වන දින අටවන උපන් දිනය සැමරූ 20 ශ්‍රීලපාහ සෙ/302321 කෝප්‍රල් ජයලත් එම්ඒවන් ගේ පුතණුවන් ගම්දු ඉදුනිල් නෙත්පහන්



2014 ජනවාරි මස 14 වන දින සිව්වන උපන් දිනය සැමරූ 20 ශ්‍රීලපාහ සෙ/312115 කෝප්‍රල් අජිත් ප්‍රියන්ත ඩී ගේ පුතණුවන් දනිදු භූපති



2014 ජනවාරි මස 05 දින පළමු උපන් දිනය සැමරූ 12 ශ්‍රීලපාහ සෙ/324433 ලාකෝ පත්මසිරි යූඩීඑන් ගේ දියණිය පේෂිකා දෙවන්සා



2014 ජනවාරි මස 16 දින දෙවන උපන් දිනය සැමරූ රෙජිමේන්තු ශ්‍රීලපාහ සෙ/304870 සැරයන් රාජපක්ෂ ආර්එස්පී ගේ පුතුණුවන් දිපන ප්‍රභාවර



2014 ජනවාරි මස 01 දින සිව්වන උපන් දිනය සැමරූ 7 ශ්‍රීලපාහ සෙ/319221 ලාකෝ ඉන්දික කුමාර ඩබ්ලිව්පී ගේ දියණිය ධනංජි නුවන්ගනා



2014 ජනවාරි මස 29 දින පළමු උපන් දිනය සැමරූ 18 (සේවා) ශ්‍රීලපාහ සෙ/ඩී100540 සාසෙ ප්‍රසන්න ආර්එස් පුතුණුවන් අග්මීන සුසිත් ප්‍රභාෂන



2014 පෙබරවාරි මස 27 දින තුන්වන උපන් දිනය සැමරූ 14 (සේවා) ශ්‍රීලපාහ සෙ/14ඩී00999 ලාකෝ ගුණවර්ධන ඩීඩීසී ගේ දියණිය සෙනුරි දිනෙත්මා



2014 ජනවාරි මස 23 දින පළමු උපන්දිනය සැමරූ 19 ශ්‍රීලපාහ සෙ/306117 බනි II කොඩිතුවක්කු කේඩීආර් ගේ පුතුණුවන් කාවිග ඉෂිවර



2014 ජනවාරි මස 14 වන දින සිව්වන උපන් දිනය සැමරූ 20 ශ්‍රීලපාහ සෙ/312115 කෝප්‍රල් අජිත් ප්‍රියන්ත ඩී ගේ දියණිය සෙනුරි නෙත්සරා



2013 දෙසැම්බර් මස 20 දින පළමු උපන් දිනය සැමරූ 2 (සේවා) ශ්‍රීලපාහ සෙ/2ඩී02795 කෝප්‍රල් වීරසිංහ ඒඩීඑස්කේ ගේ දියණිය සචිනිකා නිමාෂි



2014 ජනවාරි මස 16 දින පස්වන උපන් දිනය සැමරූ 23 ශ්‍රීලපාහ සෙ/317209 ලාකෝ ප්‍රනාන්දු සීඑස්එස් ගේ පුතුණුවන් සෙනෙත් ඉරේෂ



2014 ජනවාරි මස 28 දින සිව්වන උපන් දිනය සැමරූ 11 ශ්‍රීලපාහ සෙ/317079 ලාකෝ ඩීඑම් ගේ පුතුණුවන් තිලෝචන හරුක් සන්දේශ



8 ශ්‍රීලපාහ
රෙජිමේන්තු සැරයන් මේජර්
සෙ/304350 බනි 1 බීජීඑන්ආර් ගුණවර්ධන ආර්එස්පී



1 ශ්‍රීලපාහ
රෙජිමේන්තු සැරයන් මේජර්
සෙ/304697 බනි 1 එම්ඩීයු ජයලත්



5 (සෙවි) ශ්‍රීලපාහ
රෙජිමේන්තු සැරයන් මේජර්
සෙ/14ඩ00092 බනි I එච්එම්යූපී අබේරත්න



18 (සෙවි) ශ්‍රීලපාහ
රෙජිමේන්තු සැරයන් මේජර්
සෙ/18ඩ00011 බනි I කේඑස් තිලක්



රෙම ශ්‍රීලපාහ ප්‍රධාන ලිපිකරු
සෙ/305620 බනි I ආර්පීඑල් රාජපක්ෂ



රෙම ශ්‍රීලපාහ
රෙජිමේන්තු උපකරණ පාලන සැරයන් මේජර්
සෙ/13056 බනි I ඩබ්ලිව්ඩීජේ ප්‍රේමලාල්



1 ශ්‍රීලපාහ
රෙජිමේන්තු උපකරණ පාලන සැරයන් මේජර්
සෙ/305927 බනි 11 පුෂ්ප කුමාර එස්ඩීඑස්

සුබ මොහොතින් නව
තනතුරට පත් වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුළු සියලුම
නිලයින්ගේ උණුසුම් සුබ පැතුම්..!



20 ශ්‍රීලපාහ
රෙජිමේන්තු උපකරණ පාලන සැරයන් මේජර්
සෙ/310860 බනි II පුෂ්පකුමාර එස්එච්පී



1 ශ්‍රීලපාහ ප්‍රධාන ලිපිකරු
සෙ/307817 වරණ සැරයන් රණසිංහ එච්ආර්ජී



24 ශ්‍රීලපාහ
ප්‍රධාන ලිපිකරු සෙ/313879 වරණ සැරයන් ජයසේන ජේආර්

# රෙජිමුඛ ශ්‍රීලපාහ පුවත්

## ආබාධිත රණවිරුවන්ට අත්වැලක්



තිස් වසරක් පුරා පැවති යුද්ධයේදී අප දරණීතලයට තිරසාර සාමයක් උදාකරදීමේ උදාරතර අරමුණෙන් යුතුව යුදවැද තම ශාරීරික අවයව රට දැය වෙනුවෙන් කැපකර වීරෝදාර රණවිරුවන්ට කොළඹ ඩීඑස් සේනානායක විද්‍යාලයේ 2006 වර්ෂයේ ආදී ශිෂ්‍ය සංගමයේ ගරු සභාපති දේශාන් ප්‍රනාන්දු මහතා සහ එම සංගමයේ සාමාජිකයින් විසින් පරිත්‍යාග භාණ්ඩ බෙදාදීම සිදු කරන ලදී. 2014.02.23 වන දින ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී තුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කළේය. මෙම සුවිශේෂී අවස්ථාවට රෙජිමේන්තු මූලස්ථාන බලඇණියේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්ජ්ආර් ගුණසේකර ආර්එස්පී ශ්‍රීලපාහ මෙන්ම ඒකකයේ දෙවන අණදෙන නිලධාරි ද සහභාගි වූහ. එදින රෝද පුටු 10ක් , අත්වාරු යුවල් 50ක්, විද්‍යුත් රෝදපුටුවක් වෙනුවෙන් බැටරියක් පරිත්‍යාග වශයෙන් ලැබිනි. මෙම වීරෝදාර රණවිරුවන්ගේ කායික හා මානසික සුවය ඉතා ඉහළ තලයට ගෙන ඒමට මෙවැනි පරිත්‍යාග මනා රුකුලක් වනවා නොඅනු මානය. දේශයේ ස්වෛරීත්වය ආරක්ෂා කිරීමට තමන්ට නොහැකි වුවත් එසේ සිදු කළ අයවළුන් වෙනුවෙන් සිදු කරනු ලබන මෙවැනි පුණ්‍ය කටයුතු සැමදා අපි අගය කරන්නෙමු.

## වර්ණලාභී රණවිරුවෝ

ශ්‍රීලපාහ ඒකකයන් වෙතින් පැවති කෲරිරු යුද්ධයේදී ආබාධිත වූ රණවිරුවන්ගේ පුනරුත්ථාපන හා සුබසාධන කටයුතු මෙන්ම ශාරීරික හා මානසික මට්ටම උසස් මට්ටමකට ගෙන ඒම අරමුණුනෙන් ක්‍රීඩාවන් වෙනුවෙන් දක්ෂතා ඇති විරුවන් රෙජිමූඛ ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායමට ඇතුලත් කරන ලදී. මෙම ක්‍රීඩකයින්ගේ විවිධ ආබාධිත තත්ත්වයන් මත ක්‍රීඩා වර්ගීකරණයන් 10 ක් යටතේ කණ්ඩායම් තරඟ ඉසව් 14 ක් ඇතුලත් මලල ක්‍රීඩා උළෙලක් යුද හමුදා ආබාධිත සහිත වුවන්ගේ ක්‍රීඩා කමිටුව මඟින් වසරක් පාසා පවත්වනු ලබයි. එමෙන්ම ජාතික ආබාධිත සහිත වුවන්ගේ ක්‍රීඩා සම්මේලනය මඟින් වසරක් පාසා පවත්වනු ලබන ක්‍රීඩා උළෙල සඳහා මෙම ක්‍රීඩා කණ්ඩායමේ ක්‍රීඩකයින් සහභාගි වී විශේෂ දක්ෂතා දක්වා ඇත. ජාතික ක්‍රීඩා උළෙල සඳහා සහභාගිවන ක්‍රීඩකයින්ගේ විශේෂිත දක්ෂතා සැලකිල්ලට ගනිමින් තෝරා ගන්නා ලද ක්‍රීඩකයින් ජාත්‍යන්තර තලය දක්වා ගෙන ගොස් ජයග්‍රහණ රාශියක් ලබාගෙන ඇත.

2014 ජනවාරි මස 24 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී යුද හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂක මණ්ඩලයේ මඟ පෙන්වීමෙන් අති උත්කර්ශවත් අන්දමින් ජයග්‍රාහී ක්‍රීඩකයන් හට වර්ණ ප්‍රදානෝත්සවයක් සංවිධානය කර ගරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රීඩකයින් හට වර්ණ ප්‍රදාන පිරිනමන ලදී. ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් දක්ෂතා දක්වා ඇති



ක්‍රීඩකයින් ඇගයීම සඳහා සිදු කරනු ලබන වර්ධ ප්‍රදානයේදී මෙම ඒකකයේ ක්‍රීඩා තරු 06ක් මෙදින වර්ණ ලබාගන්නා ලදී. තවත් ක්‍රීඩකයින් 46 දෙනෙකු හට යුද හමුදා වර්ණ හිමි ගන්වා ඇති අතර, මෙම වර්ණ ලබා ගැනිම තුළින් ක්‍රීඩකයින් ධෛර්යමත්වීම මෙන්ම අප රෙජිමේන්තුවටත්, යුද හමුදාවටත් පොදුවේ ශ්‍රී ලංකාද්වීපයටත් ආඩම්බරයකි. මෙවැනි පුතුන් අප මාතෘභූමියට දායාද කළ දෙමාපියන්ට හිමි වේවා ! යි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

### යුද්ධ හමුදා වර්ණ ලැබූ රෙජිමූඛ ශ්‍රීලපාහ ක්‍රීඩාතරු

| | | | |
|---|---|---|---|
| නි/67447 | ලුතිතන් | ඒඑම්ඩීඑස් විජේසිරි ශ්‍රීලපාහ | ජාතික පැරා වොලිබෝල් |
| සෙ/311914 | සැරයන් | හේරත් එච්එම්පීබී | ජාතික පැරා මලල ක්‍රීඩා/රෝදපුටු පැසිපන්දු |
| සෙ/319035 | සැරයන් | ප්‍රියංකර එම්ඩඩබ්ලිව්ජ් | ජාතික පැරා මලල ක්‍රීඩා/වොලිබෝල්/බැඩ්මින්ටන් |
| සෙ/319602 | කෝප්‍රල් | චන්ද්‍රසේන පීඩීආර්එස් | ජාතික පැරා සවි එසවීම |
| සෙ/313049 | කෝප්‍රල් | මදුරාවේ එස්බී | ජාතික මලල ක්‍රීඩා, රෝදපුටු පැසිපන්දු, මේස පන්දු, සවි එසවීම (2012 සහ 2013 වසරේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලානය දිනා ගැනිම) |
| සෙ/312568 | ලාකෝ | වීරතුංග ඩබ්ලිව්එස්කේ | ජාතික වායු රයිෆල් වෙඩි තැබීම |

රෙජිමූඛ ක්‍රීඩා කණ්ඩායම - සෙ/308217 කෝප්‍රල් විජේසුන්දර ඩබ්ලිව්ඩබ්ලිව්එම්ජේඑස්

# ආබාධිත ශ්‍රීලපාහ තරුවක්

වර්ෂ 1993 පෙබරවාරි මස 05 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත බැදී මූලික පුහුණුවෙන් පසු 1 ශ්‍රීලපාහ ඒකකය වෙත ඇතුලත්ව රාජකාරි සිදු කළ සෙ/305323 කෝප්‍රල් එදිරිසිංහ ඊජ්ඩීඑස් තවත් සහජ හැකියාවන්ගෙන් පිරිපුන් පාබල තරුවකි. මානුෂිය මෙහෙයුම අවසන්වන තෙක් ක්‍රියාන්විත රාජකාරීන් හි නියැලි ඇති අතර, 1993 පුනරින් ප්‍රහාරයේදී සහ 1997 ජයසිකුරු මෙහෙයුමේදී ත්‍රස්තවාදි මෝටර් ප්‍රහාරයන්ට ලක් වී ආබාධිත තත්ත්වයට පත් වීමෙන් පසු රෙජිමුබ ශ්‍රීලපාහ ඒකකය වෙත ඇතුලත් කර ඇත.

මෙම කොනොනි යුද්ධ හමුදාට බැදීමට පෙර අපොස (උපෙළ) විෂයක් වූ නාට්‍ය රංග කලාවට පාසල් අවදියේ සිට මහත් උනන්දුවක් දක්වා ඇත. යුද හමුදාවට බැදීමේන් පසු තම හැකියාව වැඩි දියුණු කර ගෙන ඇත. උතුරු මැද පළාත් පාසල හා ජාතික තරුණ සේවා සභාවේ නාට්‍ය පාසල වෙතින් ලද තම හැකියාවන් වැඩි දියුණු කර ගෙන ජාතික චිත්‍රපට සංස්ථාවේ මෙහෙයවන ලද සිනමාකරණය හා අධ්‍යක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ද හදාරා ඇත.

මෙම හැකියාවන් ඔප් නංවාගෙන 1994 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා උතුරු මැද පළාත් කලා උළලේ නාට්‍ය අංශයෙන් අඛණ්ඩව නියෝජනය කර ඒ සඳහා ඉදිරිපත් කළ නිර්මාණ 11 ටම හොඳම නාට්‍ය ප්‍රථම ස්ථානය, හොඳම රචනය, හොඳම අධ්‍යක්‍ෂණය, හොඳම වේෂ නිරූපණය, හොඳම පසුතල නිර්මාණය, හොඳම සංගීතය, හොඳම ඇඳුම් නිර්මාණය සහ හොඳම රංග වින්‍යාසය යන සම්මාන එක් එක් වර්ෂයන් තුළදී හිමි කරගෙන ඇත.



එමෙන්ම 2007 වර්ෂයේ යෞවන සම්මාන උළලේ (උතුරු මැද පාළාත) හොඳම නළුවා සහ උතුරු මැද පාළාත් කලා උළලේ හොඳම නළුවාට හිමි සම්මානයද හිමි කරගෙන ඇත. 2010 වර්ෂයේ යෞවන සම්මාන උළලේ අවසන් වටයට නියෝජනය කරමින් රාජ්‍ය නාට්‍ය උළලේ ''ආපසු හැරෙව්'' සහ ''බ්ලැකවුට්'' යන නාට්‍ය නියෝජනය කරමින් සම්මාන ලබා ගෙන ඇත. මෙවන් විරු තරු හේතුවෙන් ශ්‍රී ලංකා පාබල මාතාව මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට විශාල කීර්තියක් ලබා දී ඇත. මෙවන් දක්‍ෂතා දක් වූ ඔබට අප සැම සුබ ප්‍රාර්ථනය කරන්නෙමු.

රෙජිමූබ ශ්‍රීලපාහ

## කවියාට කවියක්

කවියක අරුත දෙයි සාහිත දියුණුවට
අවියක ලෙස සැනෙයි සතුරන් නැසීමට
දිවියක රස කරයි ඉන් සුවයකි ගතට
නිරුළක සුදුසුකම ඇත රස කවියෙකුට

කිසිදා කුහක කම් නැත සිත්වල රන්දා
සැමදා පිහිට මිස නැත වෛරය බන්දා
නොමදා කිසි කෙනෙකු වලපල්ලට කැන්දා
පෙරදා ඔහුගේ ගුණ කියවෙයි ඔහු මළදා

**සෙ/10267 කෝප්‍රල් ගුණපාල එච්ජී**
**(විශ්‍රාමික) 1 ශ්‍රීලපාහ**

## හැරගිය ඔබ

මට නොකියා යන වග
දුක කියලා හොදටම
යන්න ගියේ ඇයි දෝ ඔබ...
හඬන දෙනුවන් කකියන
රිදුම් දෙයි පපුව මතට
ප්‍රේමයේ යළි නොවිදනා
හදවතක් ඇත තවම මා ළඟ...

කෝප්‍රල් ප්‍රේමරත්න පීඩබ්එල්ඩී
26 ශ්‍රීලපාහ - ඩී කණ්ඩායම

## My school

My school A/Galnewa cental college. My school is admirabal school. Our principle is Mr: Samarasinha and Mr: Ekanayaka. There clase fom grade six to grade twelve. There are about 2000 pupils and 100 teachers in my school. Offece, Libray, Home scince, Main holl, Ground in my school. My school is very beautiful. I Love my school.

**W.M. Danushka Udayantha Wanasinha**
**Grade - 8 A**
**A/Galnewa central college**

## තවත් ළමා දිනයක්

හිරු නුඹේ පියා වී නම්
සඳු නුඹේ මව වී නම්
දකින්නට තිබුනු ලොව
සොඳුරු බව
නුඹේ තරු නෙතු මුවින්
මද නළට සවන් තිබුණි නම්
ගහ කොළට සවන් තිබුණි නම්
කියන්නට තිබුනා නුඹේ දුක
සිනා වියකුණු මුවගෙන්

**සෙ/311746 සැරයන් විජේරත්න එච්එම්**
**බුද්ධි අංශය 19 ශ්‍රීලපාහ**




**20 ශ්‍රීලපාහ කෝප්‍රල් විමලරත්න ජේආර් ගේ**
**බිරිඳ එන් දමයන්ති දසනායක**

# ගෙදර බුදුන් අම්මා

රළු වැලි කතරේ පිනි වැස්ස ඔබ අම්මේ
මහ සැඩ සුළඟේ ගල් පවුරයි ඔබ අම්මේ
මුදු කරුණාවේ සාගරයයි ඔබ අම්මේ
අඳුරු වලාවේ රන් එළියයි ඔබ අම්මේ

**සෙ/328072 සාසෙ සදරුවන් එස්පීඑස්**
**ආධාරක කණ්ඩායම - 19 ශ්‍රීලපාහ**

# ආදරය කරන සිතට

මා දිලිය නැලවූ සජ්සරය ඔබමයි
සිත් සුතින් තබමින් මා මනසේ රැව්දුන්
ඔබ සුමුදු ස්වරයෙන් හෙටත් මට ලංවී
ගයන් පෙම් ගීතිකා

දාලා යන්නට හදන්නේ නොයන්නට නම්
ආදරය කරන තෙක් දිහා බලන්න එපා
මෙසේ දුක දැනෙන්නේ යන කෙනාට නොව
තනිවෙන කෙනාටය

**සෙ/327807 සාසෙ සම්පත් කුමාර**
**12 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම**

# ගතිගුණ අතින් අපි බලු වී ඇත්තේ

මේ ලක්බිමට පිටතින් ආ පිරිස මැද
ආවලු සුනඛ රජෙකුත් ඒ පිරිස මැද
මිනිසුන් ලාබදුන් ආදර සහය මැද
බල්ලා හොඳ තැනක ඇත මිනිසුනේ අද

මිනිසත් ගුණය ළඟ උපුටා ගෙන ඇත්තේ
දාහෙන් භාගයක් බල්ලා වී ඇත්තේ
බල්ලා උතුම් වී මිනිසා ළඟ ඇත්තේ
ගතිගුණ අතින් අද අපි බලු වී ඇත්තේ

බල්ලා ඇවිත් ඇත්තේ අප පිටු පස්සේ
මිනිසා රැගෙන ආ ගතිගුණ වල පස්සේ
සැගවී සිටිය මිනිසුන් ඒ ගොඩ අස්සේ
බල්ලෝ වෙල යනවා කාමය පස්සේ

බල්ලා එලෙස කෙරුවේ බලුකම හන්දා
ඇතමුන් කළේ උගෙ ඇති කොලුකම හන්දා
බොහෝ දෙනෙක් මිනිසා හට දී නින්දා
බල්ලා සිටියි දැන් ඉහළින් ඒ හන්දා

මනසින් උසස් අප ඇයි බලු වී ඉන්නේ
යහගුණ දහම ගැන සැමවිට දැන ගන්නේ
කලකින් තමයි බුදු කෙනෙකුත් උප දින්නේ
මිනිසත් කමට ගෞරව දී හැසිරෙන්නේ

**කෝප්‍රල් ජයලත් ඩබ්ලිව්ඩීඩබ්ලිව්**
**බුද්ධි අංශය 10 ශ්‍රීලපාහ**

# මගේ දුක ඔබට දැනෙනවද

කුමරි මගෙ දුක්බර කවි ඇසෙනවද
එම හඬ ඇසී මගෙ කුටියට එනවද
සිහිනෙන් නොවේ සැබවින් පෙනෙනවද
ඇවිදින් මගේ හිස පිරිමැද සිඹිනවද

අප වෙන් කලා මේ මිහිකත තුරුලේම
කඳුළැලි සමඟ මම තනිවී ඉම් තාම
එන්නට සිතේ ඔබ අසලින් සැත පෙන්න
දෙමහල්ලන් එයිද ඔවුන් අතහැර මට එන්න

සුරලොව සිහින දකිමින් ඔවුන් සුවෙන් නිදී
ඒ සිහිනෙ අප කඳුළැල් රැඳී ඇති
වැලපෙන හදට නිදිමත එන්නට නොහැකි
සිහිනෙන් වත් නුඹ දකුමට වරම් නැති

**සාසෙ විමලසේන ජීජීඩීකේඑන්**
**12 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම**



# ඔබ මා සතුවිය

ඈත අතිතෙක හමුවුන මතකය
සිහිවිය ඔබ මා හමු වූ
ඒ සොඳුරු දිනේ
මා කිසි සිතයක නොසිතු
ලෙසින් ඔබ ඔබේ හද මා
ළඟ නතර කලේ
දෙහදක සැගවුනු ආදර සිතිවිලි
මුවගින් දෙනෙතින් විවර වුනේ
ඔබ මා සතුබව සිතට හැගෙනවිට
මගෙ හද සතුටින් ඉපිල ගියේ ...

**සාසෙ උදිත නුවන් ආර්බී පාලන**
**කණ්ඩායම - 24 ශ්‍රීලපාහ**




# මගෙ ජීවිතේ

ජීවිතේ ගමනක් නම්
ඒ ගමනෙ කෙලවරතේ
ඇවිද යන්නට ගල් බොරළු නැති
වැට කඩුළු නැති
පැහැදිලි මාවතක් නැති
එහෙත් කවදා හෝ දවසක
අහස තෙක් ඉමි සිඹින
මල් පිපුණු තුරු මුදුන්
මිහිඳුම් දැවටුණු සොඳුරු ඇස
ගැටෙන්නට නම්
ගල් බොරළු මගින්
යටිපතුල් රිදෙන්නට
පා බිම කබා යා යුතුයි

**ලාකෝ ජයසේකර කේආර්ජ්**
**12 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම**

# අමතක නොකළ පිය සෙනෙහස

පාසල නිමාකොට ඉගෙනුම අවසානේ
වෙහෙසි දිව අවුත් දාඩිය දා මුහුණේ
ඔඩිහිනි වූ විටද සිනහව අඩු නුණේ
දරුවන්ගේ මුහුණ අද දැකගන්නට නැනේ

ඔබ කී සින්දු හා ගී වල හඬ
ඔබ හැදූ මල් ගසෙහි පිපි මල්වල සුවඳ
නිඳ නැති හදවතට රැය මැදියම් වුවද
ඇහෙනව දැනෙනවා මායවන් නොවෙද

උදැල්ලක් රැගෙන වත්තේ බිම කොටන
ගෙය ඉදිරියේ ලස්සන මල් ගස් වවන
දරුවන් සමඟ මගේ මව නිබඳව සිටින
කොතරම් ලස්සනද දැකුමට ඒ දසුන

බොහෝ දුර ඈත ගොස් මට නොපෙනි ඉන්න
අක්කා නංගිගේ තොරතුරු නොම දන්න
මා මෙහි සොවින් පසුවී නිරතුරු ඉන්න
සුළඟට තමයි හැකි විස්තර දැන ගන්න

කුස ගිනිනිවා ගෙන පාසල් ගොස් පැමිණ
ගේ වට පිටාවේ කුස්සියේ සැරි සරන
දුවන පනින හිනහෙන හැංගි මලන
අක්කා නංගි දුටුවාද සුළඟේ හමන

වල් ගස් උගුල්ලන ගෙමිදුල මල් වවන
පාරේ යන කවුරුත් හා සිනහා වෙන
දිය ගෙන එන ලෙසින නළ ළිඳ වෙත දුවන
දරුවන් ගම කියනු මැන මෙහි එන ලෙසින

රේදි ටික රැගෙන හිමිහිට මිදුලට බසින
සැනෙකින් දුවන තරහෙට මෙන මහට පැන
දහ÷÷÷÷වැඩ බලා සිටියෙමි ඔබගේ තුටින
දරුවෙනි කොහිද අද ඔබ සැගවී සිටින

බලවත් දුකක් සැනෙකින් නිවෙන
සිනහව ඔබෙ මතකෙට වීය සිතන පතන
ඔබගේ පියා පැල්පත් කොටයේ වෙසෙන
අමතක උනේ කොහොමද මට කියනු මැන

**සාසෙ සම්පත් ඒඩබ්ලිව්ජීඩී**
**ඩී කණ්ඩායම 19 ශ්‍රීලපාහ**

# ශ්‍රීලපාහ අන්තර් ඒකක කඹ ඇදීමේ තරගාවලිය - 2014





කඹ ඇදීමේ ක්‍රීඩාවේ ඉතිහාසය දෙස බැලිමේදී ශ්‍රී ලංකා පාබල හමුදාව නොමැකෙන මතක සටහන් තබා ඇත. ඉතිහාසයේ ශ්‍රීලපාහ රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද හමුදාව තුළ හා සිවිල් සමාජයේ දක්ෂතා දක්වා ඇත. ශ්‍රීලපාහ කඹ ඇදීමේ ක්‍රීඩා කණ්ඩායමට දක්ෂ ක්‍රීඩකයින් තෝරා ගැනීමේ අරමුණින් අන්තර් ඒකක කඹ ඇදීමේ තරගාවලියක් 2014 මාර්තු මස 17 දින සිට 19 වන දින දක්වා සිදු කරන ලදී.



රෙජිමේන්තු අධිපති තුමාගේ සංකල්පයකට අනුව රෙජිමේන්තු සේනාවිධායක තුමාගේ උපදෙස් අනුව ක්‍රීඩා භාර නිලධාරින්ගේ අධීක්ෂණය මත මෙම තරගාවලිය පවත්වන ලදී. රෙජිමේන්තු මධ්‍යස්ථාන රසල් හයින් ක්‍රීඩාංගනයේ පැවති මෙම සියලු තරඟ වෙනුවෙන් ඒකක වෙතින් දක්ෂ කණ්ඩායම් ඉදිරිපත් කරන ලදී.

මූලික තරඟ කණ්ඩායම් හතරක් යටතේ තරඟ වැදී එහිදි දක්ෂතා දක්වූ කණ්ඩායම් අට අර්ධ අවසන් තරගාවලිය සඳහා සුදුසුකම් ලැබීය. එහිදී දක්ෂතා දක් වූ 1ශ්‍රීලපාහ ඒකක කණ්ඩායම හා 19 ශ්‍රීලපාහ කණ්ඩායම අවසන් මහ තරඟය සඳහා සුදුසුකම් ලැබීය.

2014 මාර්තු මස 19 වන දින සවස් කාලයේ ශ්‍රීලපාහ ක්‍රීඩා පාලක මණ්ඩලයේ සභාපති බ්‍රිගේඩියර් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් අවසන් තරගය පැවැතිනි. එම තරගයේදී 19 ශ්‍රීලපාහ ඒකක කඹ ඇදීමේ කණ්ඩායමේ ක්‍රීඩකයෝ උපක්‍රමශිලිව ප්‍රතිවාදි කණ්ඩායම පරාජයට පත් කරමින් 2014 අන්තර් ඒකක කඹ ඇදීමේ ශූරතාවය දිනා ගන්නා ලදී.

# කාල්ටන් සුපර් ස්පෝර්ට් කඹ ඇද්ද ශ්‍රීලපාහ තරු

''තාරුණ්‍යයට හෙටක්'' සංවිධායක කමිටුව මඟින් 5 වරටත් සංවිධානය කරනු ලබන කාල්ටන් සුපර් ස්පෝර්ට් ක්‍රීඩා සැනකෙළිය මෙවරද 2014 මාර්තු මස 07 දින සිට 09 දින දක්වා තිස්සමහාරාම රන්මිණි තැන්න මොටර් ක්‍රෝස් ධාවන පථයේදී පවත්වන ලදී.

මෙම ක්‍රිඩා උළෙලේ ක්‍රීඩා ඉසව්වන් රාශියක් පැවැති අතර කඹ ඇදීමේ ඉසව්ව කාගෙත් අවධානය යොමු වූ තරඟයක් විය. යුද හමුදාව නියෝජනය කරමින් කඹ ඇදීමේ කණ්ඩායම් 02 ඉදිරිපත් විය. යුද හමුදා කණ්ඩායම් නියෝනයේදී ශ්‍රීලපාහ ක්‍රීඩකයින් 07 දෙනෙක් සහභාගි වූහ.

කණ්ඩායම් 24ක් තරඟ වැදුණු අතර, කිලෝ ග්‍රෑම් 640 බර පන්තිය යටතේ පිළිමළුන් පිටු දැකිමේ ක්‍රමයට තරග වැදුණු අතර, යුද හමුදා ඒ කණ්ඩායම සහ ගුවන් හමුදා කණ්ඩායම් අවසන් මහ තරඟයට සුදුසුකම් ලැබීය. ගුවන් හමුදා කණ්ඩායම පරාජයට පත් කරමින් කාල්ටන් සුපර් ස්පෝර්ට් කඹ ඇදීමේ ශූරතාවය හිමිකර ගැනීමට යුද හමුදා ඒ කණ්ඩායමට හැකි විය. එහි තෙවන ස්ථානය යුද හමුදා බී කණ්ඩායම විසින් හිමි කර ගන්නා ලදී.




යුද හමුදා කණ්ඩායමක් නියෝජනය කරමින් ශ්‍රීලපාහ රෙජිමේන්තුවට අභිමානයක් හා ගෞරවයක් ලබාදුන් මෙම ක්‍රීඩකයින්හට රෙජිමේන්තු අධිපත් ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම් එක්කරන්නෙමු.

මෙම තරඟාවලිය සඳහා ශ්‍රීලපාහ රෙජිමේන්තුවෙන් සහභාගි වූ ක්‍රීඩකයින්

| | | | |
|---|---|---|---|
| ඒ කණ්ඩායම - | ලාකෝ | බණ්ඩාර | එම්ආර්එස් |
| | ලාකෝ | සුරංග | එස්එච්එම් |
| | සාසෙ | බාලසූරිය | බීඒපීකේ<br>ක්‍රීඩා අංශය රෙම ශ්‍රීලපාහ |

| | | | |
|---|---|---|---|
| බී කණ්ඩායම - | කෝප්‍රල් | චන්ද්‍රකුමාර | එන්ඒඩබ්ලිව් |
| | ලාකෝ | ප්‍රියකැළුම් | එච්කේඑච් |
| | ලාකෝ | ප්‍රනාන්දු | ඒපීඒ |
| | සාසෙ | සංජීව | එම්ටීපී |

THE WHITE HACKLE

79th ISSUE - January - March 2014

# 2014 වසරේ වොලිබෝල් ශුරතාවය දිනූ ශ්‍රීලපාහ ක්‍රීඩා තරු

දිවයිනේ ප්‍රසිද්ධ වොලිබෝල් තරඟාවලියක් වන මංචි ජාතික වොලිබෝල් ශුරතාවලිය මෙවරත් 2014 මාර්තු මස 15 සහා 16 යන දිනයන්හිදී රත්නපුර ගොඩකවෙල මධ්‍යම මහා විද්‍යාලීය ගෘහස්ථ ක්‍රිඩාංගණයේදී පවත්වන ලදී. මෙවර තරඟාවලිය පවත්වනු ලැබුවේ හත්වන වතාවටය.

මෙම තරඟාවලිය සඳහා දිවයිනේ විවිධ පළාත් හා කලාප මට්ටමේ තරග පවත්වා එහි ජයග්‍රහණය කරනු ලැබූ කණ්ඩායම් 38 ක් ජාතික වොලිබෝල් තරඟාවලිය සඳහා සහභාගි වූ අතර, ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු වොලිබෝල් කණ්ඩායම බස්නාහිර පළාත නියෝජනය කරමින් එහි ශුරයන් වශයෙන් සහභාගි විය.



මෙම තරඟාවලිය ඒ සහ බී කාණ්ඩ දෙකක් යටතේ පිළිමළුන් පිටු දැකිමේ ක්‍රමයට තරග වැදුනු අතර, පාබල හමුදා කණ්ඩායම ඒ කාණ්ඩයෙන් තරගට අවතීර්න විය. එහි ප්‍රථම තරගය පොලොන්නරුව ප්‍රගත කණ්ඩායම හා පාබල හමුදා කණ්ඩායම තරග කළ අතර, එහිදී තරග 3/0 වශයෙන් ප්‍රගති කණ්ඩායම පරාජයට පත් කර පාබල හමුදා කණ්ඩායම ජයග්‍රහණය කරන ලදී. තරගාවලියේ පෙරළිකාර කණ්ඩායමක් වූ ශ්‍රීලපාහ කණ්ඩායම ඉන් අනතුරුව මන්නාරම ශාන්ත මරියා වොලිබෝල් කණ්ඩායම සහ දිවයිනේ දක්ෂ කණ්ඩායමක් වූ දෙබාගම රත්තරු කණ්ඩායම ඇතුලු කණ්ඩායම ඒ කාණ්ඩයේ සියලු කණ්ඩායම් පරාජයට පත් කරමින් ඒ කාණ්ඩයෙන් අවසන් තරගය සඳහා සුදුසුකම් ලැබීය. බී කාණ්ඩයෙන් ඉදිරියට පැමිණි ගල්ගමුව නිව් ස්ටාර් කණ්ඩායම අවසන් තරගයට සුදුසුකම් ලැබීය.

අවසන් මහ තරගය 2014 මාර්තු මස 16 වනදින පැවති අතර, පැමිණි සිටි සියලුම ක්‍රීඩා ලෝලින්ගේ සිත් තුළ කුතුහලයක්ද සමඟින් මෙම ප්‍රබල කණ්ඩායම් දෙකෙන් කවුරුන් ජයග්‍රහණය කරාවිද යන්න ශවුන්ට ප්‍රශ්නාර්තයක් වූහ. තරගාවලිය ආරම්භයේදී ගල්ගමුව නිව් ස්ටාර් කණ්ඩායම ප්‍රබල තත්ත්වයක පසුවූවද පාබල හමුදා කණ්ඩායම උපක්‍රමශිලිව තරග කිරීමෙන් ප්‍රබල තරගයකින් අනතුරුව තරග වට 4/3 ලෙස ජයග්‍රහණය කරන ලදී. ඒ අනුව 2014 වසරේ මංචි ජාතික වොලිබෝල් ශුරයින් බවට ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු වොලිබෝල් කණ්ඩායම ශුරතාවය හිමි කර ගන්නා ලදී. එහිදී සෙ/ඩී100758 සාසෙ සාම කුමාර කේඑම්එස් තරගාවලියේ දක්ෂතම ක්‍රිඩකයා වශයෙන්, සෙ/ඩී100745 සාසෙ මාරසිංහ එම්ජ්බීඑම් තරගාවලියේ දක්ෂතම පන්දු සකසන්නා වශයෙන් කුසලානය දිනා ගන්නා ලදී.

මෙම අවසන් මහා තරගාවලිය සඳහා ප්‍රධාන ආරාධිතයා වශයෙන් පැමිණියේ වොලිබෝල් ක්‍රීඩාවට කැපවීම් සිදු කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රි ගරු කාංචන ජයරත්න මැතිතුමා ය. මීට අමතරව ප්‍රදේශයේ මැති ඇමැතිවරු විශාල සංඛ්‍යාවක් සහභාගි වූහ. පැමිණි සිටි ජනතාව ඉදිරියේ දිවයිනේ ජාතික වොලිබෝල් ශුරයින් බවට පත්වීම ශ්‍රී ලංකා පාබල හමුදාට මෙන්ම සමස්ත යුද හමුදාවටත් මහත් ආඩම්බරයක් මෙන්ම ගෞරවයකි.

ක්‍රීඩා අංශය රෙමෙ ශ්‍රීලපාහ



# අමතක නොකල පිය සෙනෙහස

පාසල නිමාකොට ඉගෙනුම අවසානේ
වෙහෙසි දිව අවුත් දාඩිය දා මුහුණේ
බඩගිනි වූ විටද සිනහව අඩු නුනේ
දරුවන්ගේ මුහුණ අද දැකුමට නැනේ

ඔබ කී සින්දු හා ගී වල හඬද
ඔබ හැදූ මල් ගසෙහි පිපි මල්වල සුවද
නිදි නැති හදවතට රය මැදියම් වුවද
ඇහෙනව දැනෙනවා මායවන් නොවෙද

උදැල්ලක් රැගෙන වත්තේ බිම කොටන
ගෙය ඉදිරියේ ලස්සන මල් ගස් වවන
දරුවන් සමග මගේ මව නිශ්ශබ්දව සිටින
කොතරම් ලස්සනද දැකුමට ඒ දසුන

බොහෝ දුර ඈත ගොස් මට නොපෙනි ඉන්න
අක්කා නංගිගේ තොරතුරු නොම දන්න
මා මෙහි සොවින් පසුවී නිරතුරු ඉන්න
සුළඟට තමයි හැකි විස්තර දැන ගන්න

කුස ගිනි නිවා ගෙන පාසල් ගොස් පැමින
ගේ වට පිටාවේ කුස්සියේ සැරි සරන
දුවන පනින හිනහෙන හැංගි බලන
අක්කා නංගි දුටුවාද සුළඟේ හමන

වල් ගස් උගුල්ලන ගෙමිදුල මල් වවන
පාරේ යන කවුරුත් හා සිනහා වෙන
දිය ගෙන එන ලෙසින තළ ළිද වෙත දුවන
දරුවන් ගම කියනු මැන මෙහි එන ලෙසින

රෙදි ටික රැගෙන හිමිහිට මිදුලට බසින
සැනෙකින් දුවන කරගෙකි මගට පැන
දඟවැඩ බලා සිටියෙමි ඔබගේ තුටින
දරුවෙනි කොහිද අද ඔබ සැඟවී සිටින

බලවත් දුකකි සැනෙකින් සිත නිවන
සිනහව ඔබෙ මතකෙට එයි නිබදව සිතන
ඔබගේ පියා පැල්පත් කොටයේ වෙසෙන
අමතක උනේ කොහොමද මට කියනු මැන

සෙ/322347 සාසෙ සම්පත් එඩබ්ලිව්පීඩී
ඒ කණ්ඩායම 19 ශ්‍රීලපාහ

# පායන හිරු වැන්න

ඔසරිය ඇදන් ඉනවට හෙරිය තඹාගෙන
වරලස ගොතා පිට මැද්දේ හෙලාගෙන
පොත් ගොන්නක් ඉගවිය මත රුවාගෙන
පාසල වෙත යයි තුරුලිය උදෑසන

ඇය යන මාවතේ වන මල් පිබිදෙන්නේ
වන වදුලේ කිරුළුනුන් ගී හඬ දෙන්නේ
බණ්ඩි ගොයම මද සුළඟට ලෙළ දෙන්නේ
අපේ ගමට ඇය පායන හිරු වැන්නේ

ලාකෝ සුරංග බණ්ඩාර ජීඑම්
ඩී කණ්ඩායම 26 ශ්‍රීලපාහ

# නෙතින් කියූ රහසක්

කටු ඉපල් මත රැඳුන
නුඹේ පොඩි පා දුටිමි
කලාතුරකින් දකින
සිනාවක් මුව රැඳුනි
සල්පිලක දොරටුවෙන්
සෙව් සළු පිලිවලින්
නිරතුරුව ගත වැසුනි
දඟකාර ළමා විය
සොරුන් ගෙන
ගොස් තිබුණි
ඔබ දෙඩු රළු වදන්
උනුන් සිත් පාරමින්
උපන් කඳුළක් නෙතින්
සැනින් ඉගිලි වැටුනි
නුඹේ වීඩා නෙත් තුළින්
හෙට දිනක මග පෙනුනි
නුඹේ නෙත් යුග තුළින්
මගේ රුව මම දුටිමි

සැරයන් විජේරත්න එච්එම්
බුද්ධි අංශය 19 ශ්‍රීලපාහ

# නිර්මල සෙනහස


පුංචි පුංචි මල් පිපිලා
හද ජීවන මං තලයේ
ඔබේ නමින් ඔබ වෙනුවෙන්
සුවඳ හමනවා
අමාවක වැනි දිවියට
පුන් සඳ සේ ඔබ ඇවිදින්
සංසාරෙ පුරුදු ලෙසින්
එළිය දෙනවා
හැමදාමත් සිත් අහසට
තරුවක් සේ නුඹේ සෙනෙහස
ආදරයෙන් පුද කරමින්
නිති හිනහෙනවා
හැමදාමත් හඬ වැටුන
මගේ පුංචි ආත්මයට
ආයෙත් නම් නොහඬා වී
සිතුම් කියනවා
සංසාරෙන් සංසාරයට
ඔයා ළඟින් එන සුවදට
එදා වගේ හැමදාමත්
සෙනෙහෙ පුරනවා

20 ශ්‍රීලපාහ කෝප්‍රල් විමලරත්න ජේආර්
ගේ බිරිඳ එන් දමයන්ති දසනායක

# දිවිය දුන් නුඹට

කියාදෙන්න මට නුඹේ
ඇස් දෙකින්
ජීවිතේ දකින හැටි නුඹේ
හදවතින්
ජීවිතේ විඳින හැටි ඒත්
කවදාවත්ම
කියන්නට එපා
නුඹ නැතිව ජීවත් වෙන හැටි

සෙ/330150 සාසෙ ලක්ජය ඒටී
බී කණ්ඩායම 19 ශ්‍රීලපාහ




# වැස්ස

අහසේ වළාකුළු එකිනෙක ගැටෙන විට
සැඩ සුළඟට ගස් වැල් ඇඹරෙනා විට
අහස පුරා ඉරිවාගේ අකුණු පහරට
විහඟුන් පියඹා යයි සිය කැදළි තුළට

මුතු කැට මෙන් වැසි හෙමිහිට ඇසෙන විට
මුලු පෙදෙසම සැඩ වැස්සෙන් තෙමෙන විට
පුංචි සංදියේ නංගියි මමයි ඔරු සදා යවන විට
මට මහ සොම්නසක් ඇත අද වැහි වැටෙන විට

හෙන හඬ පුපුරුවා එන්නේ වේගෙන් ඊයක්ය
බිය වී කැදලි කරා යන්නා විහඟුන් පොකුරක්ය
සට සට ගඟා වැටෙනා පිනි පොද අසිරියක්මය
ඇඟ හිරිපොලා යයි පිනි ඉසිරෙන විටෙය

සෙ/329987 ලාකෝ සාලින්ද විඑච්ඩී
ඩී කණ්ඩායම - 26 ශ්‍රීලපාහ

# මාගේ සිහිනය නුඹයි

නින්ද නේන පාලු රැයක
දොර අගුළු ඇරන්
මටත් හොරෙන් සිතට එන්න
ආදරෙන් අරන්
සදා සාවිය හොරෙන් ඇවිත්
තරු පොකුරු අරන්
ආදරේට මිහිරි කවිය
හදවතට කියන්

**කෝප්‍රල් ජයරත්න එච්පි**
**ඕ කණ්ඩායම 26 ශ්‍රීලපාහ**

# අහිමි නිහඬ රාත්‍රිය

නිහඬ රාත්‍රිය උදාවෙලා
මා තනියම මුර කුටියේ
මගේ පාලුව නුඹ සිටියානම්
මට ඒ පාලුව තනියම නැතිවෙයි
එත් මේ අහිංසක ජීවිතේ දුප්පත්කම
මුදල් වෙනුවෙන් නුඹත් දුරස් වෙලා
මගේ ආදරය තනිකම මේ කඳවුර
තුළ හිරවෙලා ඉකි බිඳියි

**කෝප්‍රල් විජේරංජිත් ජේඑල්**
**ඒ කණ්ඩායම 19 ශ්‍රීලපාහ**

# අහිමි මා පිය සෙනෙහස

තිස් වසරක යුද්දයක් නිසා අහිංසක
ජනයා හට දේපල අහිමි විය
බිරිඳට ස්වාමියා අහිමි විය
ස්වාමියාට තම බිරිඳ අහිමි විය
දෙමාපියන්ට ආදරණීය දුවා දරුවන් අහිමි
විය ඥාතීන්ට ආදරණීය ඥාතියා ද මිතුරන්ට
සෙනෙහබර මිතුරා අහිමි විය
එහෙත් දැන් ඔවුන් සැමට සියලු දේ ලැබී ඇත

**ලාකෝ දයාරත්න එස්බීඑම්ඩී**
**ඒ කණ්ඩායම 19 ශ්‍රීලපාහ**

# මුහුදු වෙරළ බදු ජීවිතේ

ඇති තුරු වෙරළ ඇත්නම්
වෙරළේ ඇත පෙම්වතෙක්
ඇතිනම් පෙම්වතියක්ද ඇත
සිතක් නම් ලොවක් ඇත
කිසිවක්ම නැත
සිත ගත නොසන් වු විට
අරුමයක් නම් පින් බිමේ

සාසෙ දිසානායක ඩීඑම්එච්කේ
ආධාරක කණ්ඩායම 19 ශ්‍රීලපාහ

# අහිමි පෙමම


ලියන්නෑ මං තවත් කවියක්
ඔබේ සෙනෙහස ගලපලා
ඒ දෙනෙතින් දුටුව සිහිනය
මගේ කඳුළින් බොදවෙලා

මිරිගුවක් වී මැවූ ලෝකය
ගව් ගණන් දුර විසිවෙලා
අපට අප නැති ලොවක අද
අපේ ජීවිත නැවතිලා

වසන්තයෙ එක ලස්සන දවසක
අහම්බෙන් නෙත් හමුවෙලා
සුන්දරයි අප එක්ව ආ මඟ
ආදරෙන් අත් පටලලා

අඟුළු දැම්මත් එමන් සලකුණු
හිතේ මුල්ලක සඟවලා
තරහ නෑ මං කවදාවත්ම
ගියත් ඔබ මා තනිකර දාලා

**ආසෙ සම්පත් කේඑච්කේ**
**ඕ කණ්ඩායම - 12 ශ්‍රීලපාහ**



# ඔබ

| | |
|---|---|
| නොසිදෙනා තත් අතර නොවැයෙනා | ඔබ |
| නොපියෙනා නෙත් අතර නොපෙනෙනා දසුන | ඔබ |
| නිශායම එකළු කළ සුපුන් සඳ මඬල | ඔබ |
| ජීවිතේ ගමන් මඟ හමු වූ මහ බලය | ඔබ |
| විරාගත තිමිර පට මුදාහැර පවන | ඔබ |
| සාදා හදවතේ රැඳි දැහැන් බිඳී ගිය | ඔබ |
| ලොවක් අබිමුවේ පෑ පිළිරූ බිඳී පහර | ඔබ |
| හඹා ආ සුමට ඉම බොරළු ඇතිරුවේ | ඔබ |
| අහඹුවෙන් ළඳක් තම අරුත් බව කළේ | ඔබ |
| සිත නිල් කඳුකරය දවා අළු කළේ | ඔබ |
| නෙතින් පිටු දැකි පහස කරා යොමු කළේ | ඔබ |
| මධු විතට බිඳු හෙලන සිදී එය පැතුම | ඔබ |

- පොත පත ඇසුරෙන් -

**සෙ/319651 කෝප්‍රල් ලක්ෂ්මන් කුමාර ඒඑම්**
**26 ශ්‍රීලපාහ ඕ කණ්ඩායම**

ජීවිතේ අහිමි කාලයේ මා ළඟින් හිද
මට ඔබේ ආදරේ දුනෙම්ජීවිතේ ලස්සනම කාලයත්
ඔබ මා ළඟින් හිඳීම මට සතුටකි
ඒත් මට හිතාගන්නට අපහසුය ඔබ
ඇත්තටම මට ආදරේ කරනවාද කියා අහම්බෙන්
හමු වී ඔබේ බිරිඳවීම ගැන මා සතුටු වෙමි

**සාසෙ විජේකෝන් ඩබ්ලිව්එම්එස්ජේ ගේ**
**ආදර බිරිඳ සුදූ**

# කළල පුතුට

| | |
|---|---|
| කාත් කවුරුවත් නැති කාලෙකදී | මට |
| නුඹත් ඇවිත් ගෙණදුනි අපමණ | සතුට |
| ඒත් මයේ පුතේ සිදු වෙයි | කියන්නට |
| තාත්තෙකුත් ඕනෑමය | කළලෙකට |
| සෙනේ විඳි කමුත් කුස තුළ | උණුසුමට |
| දිනේ අදයි වෙන් වී යන්නට | අපට |
| දුනේ වෙනස උඹ ගැහෙනා හැටි | බියට |
| අනේ කඳුළු එනවද පුතුනේ | ඇසට |
| පෑහෙන්නට බැරි වූ ලොව උඹට | මට |
| නුඹ වෙනුවෙන් ළැම එරෙනා කඳුළු | කැට |
| පෑගෙන්නට නොදමා හෙම | මිනිසුන්ට |
| පූදින්නට ඉසිම් මල් ගස් | මුලට |

**සෙ/18ඕ00058 කෝප්‍රල් ජයරත්න ඕඑන්**
**සී කණ්ඩායම 18(සෙව්) ශ්‍රීලපාහ**




## ප්‍රහේලිකා අංක 58 - 79 වන වයිට් හැකල් සඟරාව

නිවැරදි විසඳුම්පත් 2014 අප්‍රේල් මස 15 වන දිනට පෙර එවිය යුතුය.

තරඟ කූපනය සහ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

### වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 58

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 4 | 3 | 5 | | 2 | | 8 | 6 |
| 2 | | 7 | 3 | | 9 | 4 | 1 | |
| 9 | 6 | | 4 | | 8 | 7 | | 3 |
| 6 | 7 | 1 | 9 | 4 | 5 | 8 | 3 | |
| | | | 7 | | 1 | 6 | | 9 |
| 5 | 3 | 9 | 2 | 8 | 6 | | 4 | 7 |
| | 5 | 4 | 8 | | 3 | 2 | 6 | |
| 3 | | 6 | 1 | | 4 | | 7 | 8 |
| 8 | | 2 | 6 | 5 | | 3 | 9 | |

### ප්‍රහේලිකාව ගැන...

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.
2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.
3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.
4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.
5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.
6. කුඩා කොටුවක් තුළ හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

# වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 56

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 3 | 1 | 4 | 5 | 6 | 9 | 2 | 7 | 8 |
| 9 | 7 | 6 | 4 | 8 | 2 | 1 | 3 | 5 |
| 2 | 8 | 5 | 1 | 3 | 7 | 6 | 9 | 4 |
| 8 | 6 | 3 | 2 | 1 | 5 | 7 | 4 | 9 |
| 1 | 9 | 7 | 6 | 4 | 3 | 8 | 5 | 2 |
| 5 | 4 | 2 | 9 | 7 | 8 | 3 | 1 | 6 |
| 6 | 5 | 1 | 7 | 2 | 4 | 9 | 8 | 3 |
| 4 | 2 | 8 | 3 | 9 | 1 | 5 | 6 | 7 |
| 7 | 3 | 9 | 8 | 5 | 6 | 4 | 2 | 1 |

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගී විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහන හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/-, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගී දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරේ වම් පස උඩ කෙලවරේ වයිට් හැකල් ප්‍රහේලිකා අංක 58 යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රෙජිමේන්තු ශ්‍රීලපාහ,
යුද්ධ හමුදා ජනපදය,
පනාගොඩ, හෝමාගම.

## මෙවර ජයග්‍රහකයෝ

**ප්‍රථම ස්ථානය**
සෙ/318436 කෝප්‍රල් රාජකරුණා ඩබ්ලිව්ඩීපී
මූලස්ථානය 25 ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
පෙරියකාඩු - වව්නියාව.

**දෙවන ස්ථානය**
සෙ/31507 සැරයන් ප්‍රේමසිරි පීජීඑල්ඩබ්ලිව්
නිලධාරි නිවස්නය ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
පනාගොඩ - හෝමාගම.

**තුන්වන ස්ථානය**
සෙ/14ඩී00724 කෝප්‍රල් කපිල බණ්ඩාර වයිආර්
14 (සෙව්) ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
කැලණිමුල්ල -අංගොඩ-.

## වයිට් හැකල් ප්‍රහේලිකාව

**58**

### කූපනය

අංකය : ..............................
නිලය : ..............................
නම : ..............................
රාජකාරී ලිපිනය : ..............................
..............................
..............................
ඒකකය : ..............................
ජාතික හැඳුනුම්පත් අංකය : ..............................

# WAR HEROES MEMORIAL SRI LANKA LIGHT INFANTRY



අප සමග උරෙන් උර ගැටී සටන්බිමේ පෙරමුණ ගෙන ක්‍රියා කර ප්‍රාණදානයෙන් ඇප කැප වූ නිලධාරීන් හා සෙබළුන් 3807 දෙනෙකු සඳා අනුස්මරණය කිරීම සඳහා එවකට රෙජිමේන්තු අධිපති වත්මන් යුද්ධ හමුදාධිපතිතුමන් ගේ සංකල්පයකට අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ සේවා අත්දැකීම් ඇති, විශ්‍රාමිකයින් හා සියළුම සෙබළුන්ගේ දිරිමත් කිරීම් හා ශ්‍රම ධන පරිත්‍යාගයෙන් යුතුව ඉදි වන රණවිරු ස්මාරකයේ ඉදි කිරීම් කටයුතු සිදු වන ආකාරය ඡායාරූපවලින් දැක්වේ.














66 වන ජාතික නිදහස් උත්සවය